# ග්‍රාමීය පරිසර පාලනය

එම්.පී. මුවර්
ගාමිණී වික්‍රමසිංහ

වාර ප්‍රකාශන මාලා අංක 16 1978 දෙසැම්බර්

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
තැ: පෙ: 1522, කොළඹ 7.

2009/06
2010/04

# ග්‍රාමීය පරිසර පාලනය.

එම්.පී. මුවර්
ගාමිණී වික්‍රමසිංහ

වාර ප්‍රකාශන මාලා අංක : 16.

1978 දෙසැම්බර්

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත, කොළඹ 7.

22128

22128

# පරිවර්තන හා සංස්කරණ කටයුතු

ඩී. ගමගේ සහ
එච්.එම්.සී. කපිලරත්න

# පෙරවදන

'ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශයේ කාර්යක්ෂම ශ්‍රම භාවිතය සම්බන්ධව දකුණු මුහුදුබඩ තැනිතලාවේ පිහිටි තෝරා ගත් ගම්මාන තුනක් සම්බන්ධව අධ්‍යයනය කිරීමේ ප්‍රධාන පර්යේෂණ වැඩ සටහනක දී මතු වූ සමහරක් ප්‍රශ්න ආශ්‍රයෙන් එහි කොටසක් වශයෙන් මෙම ලිපිය සකස් වී ඇත.

තෝරා ගන්නා ලද ගම් තුළ කැලෑ හෙළි පෙහෙළි කිරීමේ අනර්ථකාරී ප්‍රතිඵල ග්‍රාමීය, වාරිමාර්ග හරියාකාරව නඩත්තු නොකිරීම, ග්‍රාමීය මට්ටමේ කාර්ය භාර ශිල්පීය සුදුසුකම් ලත් නිලධාරීන් හා එම ප්‍රදේශයන් ගැන ලබා ගත් අත්දැකීම් මත පදනම් වූ ඥානසම්භාරයෙන් එම නිලධාරීන්ට සහාය විය හැකි ගොවීන් අතර අදහස් හුවමාරුවක් නොවීම, පරිසරය මනා ලෙස පාලනය නොවීමට විශේෂයෙන් ම ග්‍රාමීය මට්ටමක කෘෂි කාර්මික පරිසරය අනිසි පාලනයට හේතු සාධක වන කරුණු වශයෙන් අවධාරණය කෙරේ. ග්‍රාමීය පරිසරය රැක ගැනීම උදෙසා කෙරෙන මූලික සැලසුම් වැඩ සටහනක දී සලකා බැලිය යුතු වටිනා යෝජනා කිහිපයක් මෙහි ඉදිරිපත් කෙරේ.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට සම්බන්ධව අවුරුදු දෙකක පමණ කාලයක් පර්යේෂණ කටයුතුවල යෙදුනු එක්සත් රාජධානියේ සසෙක්ස් විශ්ව විද්‍යාලයේ, සංවර්ධන අධ්‍යයන ආයතනයේ පර්යේෂක, එම්.පී. මුවර් මහතා සහ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී, පී. වික්‍රමසිංහ මහතා විසින් මෙම වාර්තාව සකස් කරන ලදී.

ටී.බී. සුබසිංහ
අධ්‍යක්ෂ.

# හැ ඳි න් වී ම

පසුගිය වසර දෙකක් තුළ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි තෝරා ගත් ගම්මාන තුනක* කරන ලද පර්යේෂණ වැඩ සටහනක එක් අංශයක කෙටි වාර්තාවකි, මේ. මෙහි දී මතු කරන ලද ප්‍රශ්න (මතු කෙරෙන ප්‍රකාශනයක දී) වඩා දීර්ඝ ලෙස සාකච්ඡා කෙරෙනු ඇත. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ, ටී.බී. සුබසිංහ මහතා විසින් මෙසේ වෙනම වාර්තාවක් පිළියෙළ කිරීමට අප උනන්දු කෙළේ මෙම විෂය සම්බන්ධව උනන්දුවක් දක්වන්නාවූත්, එහෙත් දීර්ඝ වාර්තාවක් කියවීමට කාලය වැය කිරීමට අපොහොසත් අය ගේ අවධානය සඳහා ප්‍රමාණවත් සේ කෙටි එකක් කරනු අදහසිනි.

මෙම වාර්තාව පැන නැගුනේ සුළු ගොවි අංශයේ ඵලදායිතාවය ඉහළ දැමීමේදී උත්පාදනය සම්බන්ධව ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු වුනු පර්යේෂණ වැඩ සටහනක් තුලිනි. අපි මෙහි සඳහන් කරන පාරිසරික ප්‍රශ්න පිළිබඳව පර්යේෂණයේ මුල් අවස්ථාවන්හි වැඩි අවධානයක් නොයෙදුණි. මෙවැනි ප්‍රශ්න සම්බන්ධව සැලකිල්ල යොමු කරමින් දිස්ත්‍රික්කය හෝ ගම් තෝරා ගන්නා ලද්දේද නොවේ. මෙත යින් බලන විට ගම්මාන තුනම සසම්භාවී ලෙස තේරී ඇතැයි කිව හැක. අපට ලබා ගත හැකි වෙනත් සියළු ම කරුණු අනුව බලන විට මෙම ගම්මාන අසාමාන්‍ය ඒවා ද නොවන බව පෙනේ. ඒ ඒ ප්‍රදේශවල පවත්නා දේශගුණය, භූ ලක්ෂණ, වෘක්ෂ ලතාදිය හා භෝග රටාවන්ට අනුකූලව වෙනස් ආකාර වලින් මතු වුව ද, ශ්‍රී ලංකාවේ මුළු ග්‍රාමීය අංශයේ ම මෙවැනි සමාන අවස්ථා සහ තත්වයන් පැතිරී ඇති බව පෙනේ.

'පරිසරය, පරිසර ය පාලනය' වැනි වචන නව පන්නයේ නූතන ව්‍යවහාරයන් වී තිබේ. එසේ වුව ද, එම වචන වල ප්‍රයෝජනය හෝ වැදගත්කම නොසලකා සිටිය යුතු නොවේ. අප මෙහි දී ඉහත කී වචන භාවිතා කරමින් පස, ජලය සහ වෘක්ෂලතාදිය, එනම් කෘෂිකාර්මික පරිසරය කෙරෙහි අවධානය යොමු කරමිනි. අප මෙය වී ගොවියා පෙරදැරි කර ගෙන පරීක්ෂාවට ලක් කර ඇත්තෙමු.

මෙම වාර්තාව පදනම් වූ පර්යේෂණය සඳහා ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, සහ එක්සත් රාජධානියේ විදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ, විදේශීය පර්යේෂණ සම්බන්ධව සමාජ හා පර්යේෂණ කමිටුවේ සහයෝගය ලැබුණි. වී.ඒ. ප්‍රේමචන්ද්‍ර, වී. සැම්සන්, ඩබ්ලිව්.එම්. විජේපාල සහ පි.එම්. සෝමසිරි යන මහතුන් ගෙන් ක්ෂේත්‍ර කටයුතුවල දී අගය කළ නොහැකි තරම් සහයෝගයක් ලැබුණි. මෙම පිටපත යතුරු ලියනය කිරීමේ කාර්යයෙහි දී මහඟු සේවයක් එස්. කරුණාරත්න මෙහෙත්මිය ගෙන් ලැබුණි.

එම්.පී. මුවර්
ජී. වික්‍රමසිංහ

* වැලිගලගොඩ, වත්තේගම, පොල්පිටිය – ව්‍යාජ නාමයෝ ය.

# පිහිටීම

අධ්‍යයනයට ලක් කරන ලද ගම්මාන තුනම ශ්‍රී ලංකාවේ නිරිතදිග කොටසේ වෙරළබඩ තැන්නේ පිහිටා තිබේ. මෙම තැනිතලාව, තැනිබිම්වල වී කුඹුරු සහ උස් ගොඩ ඉඩම්වල විවිධ වර්ග යේ වෘක්ෂ වගාවෙන් ද යුක්ත කඳු වැටි සහිත භූමි භාගයකි. ගම්මාන පිහිටා තිබෙන ප්‍රදේශවල කඳු බිම් සාමාන්‍ය වශයෙන් අඩි තුන්සියය ඉක්මවා නොයේ. සියල්ල ම ගම් තෙත් කලාපයට අයත් වේ. ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් බලන කළ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක අනාගතයේ දී දියුණු කළ හැකි අවස්ථාවන් සීමිත බව පෙනේ. දිවයිනේ අනෙක් පරිපාලන දිස්ත්‍රික්ක විස්ස සමඟ සසඳා බලන විට මෙම දිස්ත්‍රික්ක දෙකෙහි සාමාන්‍ය වී අස්වැන්න පහළ මට්ටමක පවතී. එක් හේතුවක් වන්නේ ඝන වලාකුළු තට්ටුවක් මගින් හිරු එළිය සීමා වීම යි. අනෙක් කරුණ නිතර නිතර සිදු වන ජල ගැලීම් ය. උස් නොවන කඳු වැටි මෝසම් හද වැසි වලින් ලැබෙන ජලය රඳවා ගන්නේ ඉතා අල්ප වශයෙනි. තැනිතලාවල බිම්වල පිහිටි වී කුඹුරු නිතර නිතර ජලයෙන් යට වී යයි. මෙහි වෙරළබඩ පහත් මට්ටමේ ඇති විශාල කුඹුරු යායවල්, වගුරු බිම් නිතරම වැඩි කාලයක් තිස්සේ ජලයෙන් යට වී තිබෙනු දක්නට ලැබෙයි. දිවයිනේ අනෙක් කොටස් සමඟ සසඳා බලන විට වී වගාව සඳහා ජල පාලනය කිරීමට මෙහි ඇත්තේ සීමිත හැකියාවක් පමණි. මෙම දිස්ත්‍රික්ක තුළ මහාපරිමාණ වාරිමාර්ග ව්‍යාපාර කිසිසේත් නැති අතර, වෙනත් ස්වභාවයේ වාරිමාර්ග ව්‍යාපාර ඇත්තේ ද සුළු වශයෙනි.

'වැලිගලගොඩ' ගම පිහිටා ඇත්තේ නිසරු වැලි පසින් යුත් උස් බිම් සහිත තැනිතලාවක ය. දශක කිහිපයකට උඩ දී ගමෙන් වැඩි කොටසක් ම කැලෑවෙන් වැසී තිබූ අතර, දෙවන ලෝක යුද්ධ සමයේ දී වගා කිරීමට හා නිවාස ඉදි කිරීම සඳහා හෙළි පෙහෙළි කර ගන්නා ලදී. දැනට කැලෑවක් නැත. ප්‍රධාන ගොඩ ඉඩම් වගාව පඳුරු වශයෙන් වගා කෙරෙන කුරුඳු ය. කුරුඳු වගා කරනු ලබන්නේ තේ, රබර්, පොල් වැනි උස් බිම්වල කළ හැකි අනෙකුත් වගාවන් සමඟ සසඳන විට මෙහි ඇති නිසරු පසට හාත්පසින් ම ඔරොත්තු දෙන වගාව එය වීම හේතු වෙනි. උස් බිම් සහිත පෙදෙසක පිහිටීම නිසා ජලය ඉතා ඉක්මණින් බැස යන අතර, කුඹුරු යට වී යාමෙන් ඇති වන තත්වයන්ට මුහුණ දෙන්නට සිදු නොවේ. එහෙත් වැලිගලගොඩ කුඹුරු වලින් ජලය බැස යන අවට ගම්මානවල මෙම ප්‍රශ්නය දක්නට ලැබේ. එකම කොන්ක්‍රීට් ඇනිකට් එකකට අමතරව කුඹුරු යායවල් අද්දරින් වැටෙන පිටවාන මගින් වාරිමාර්ග සහ අපවහන කාර්ය යන් ඉටු කෙරේ.

වත්තේගම වූ කලී ඕග පටු පිටියාවතක කොටසකින් හා එහි කෙළවර කඳු සහිත භූමි භාගයකින් සමන්විත ගම්මානයකි. ප්‍රධාන ඇලෙන් වාරිමාර්ග හා ජල අපවහන පහසුකම් ලබා ගන්නා පිටියා වතේ අනෙක් ගම්මාන ද මෙම ගමට ඉහළින් සහ පහළින් පිහිටා ඇත. කුඹුරුවලට ජලය බෙදා හැරීම සඳහා මෙම ඇලෙහි කොන්ක්‍රීට් ඇනිකට් කිහිපයක් ඉදි කර ඇත. මෙම ගත වර්ෂය ආරම්භයේ දී අවට ඇති කඳු බිම් කැලෑවෙන් වැසී තිබුණි. මුල් දශක කිහිපයක තුළ වතු වගාව සඳහා ප්‍රධාන වශයෙන් තේ සහ ආරම්භයේ දී සෑහෙන කොටසක් රබර් සඳහා ද මෙම කැලෑ

හෙළි කරන ලදි. දැනට කැලෑව දක්නට නොමැති අතර, ගැමියන් ගේ කුඩා ඉඩම් කොටස් ද ඇතුළුව සියලු ම යොදා ගත හැකි ගොඩ ඉඩම්වල හේන් වගා කර ඇත.

'පොල්පිටිය' නොගැඹුරු තැනිතලාවක් මධ්‍යස්ථව පිහිටි පුළුල් කුඹුරු යායකින් යුත් ගම්මානයකි. මෙම කුඹුරු යාය මුහුදු මට්ටම දක්වා දිවෙන අතර, එහි දී මාතරින් මුහුදට වැටෙන නිල්වලා ගඟේ මෝය අසලින් ගං ඉවුරට සම්බන්ධ වේ. ගමේ ගොඩ ඉඩම් වැඩි කොටසක් කුඹුරු ඉඩම් වලට වඩා අඩි කිහිපයකට වඩා උස් නොවන අතර, ඒවා පොල් වගාවෙන් යුක්ත ය. අභ්‍යන්තරව පිහිටි ගොඩ ඉඩම් ක්‍රමයෙන් උසින් වැඩි වන අතර, ඒවා කුරුඳු වගාවෙන් යුක්ත ය. පොල්පිටිය, තෙත් කලාපයේ ආන්තිකව හා ග්‍රාමීය සුළු වාරිමාර්ග වැව් පෙළක් ලක්ෂණයක්ව පවතින අන්තර් මධ්‍ය සහ වියළි කලාපයන්ට ඉතා ආසන්නව ද පිහිටා ඇත. සැතපුමක් පමණ දුරින් පිහිටි විශාල වැවක ජලයෙන් පෝෂණය වන අක්කර හතළිහක් පමණ වැවක් පොල්පිටිය යාය ඉස්මත්තේ පිහිටා ඇත. මෙම වැවේ ජලය බෙදා හැරීමට ප්‍රමාණවත් ඇල මාර්ග සහ ඇනිකට් ජලායක් පවතී. අපවහන ජලය ගඟට එක් වන යාය පහළ අන්තයේ ද ඇනිකට් ගණනාවක් තිබේ. මෙම ස්ථානයේ ගඟ රළ සහිත වන අතර, වඩදිය අවස්ථාවල ඇනිකට් වසා නොතිබුවහොත් ලවණ ගං දිය පහළ කුඹුරු තුළට ගලා යයි. වගා කිරීමට හැකි වීම සඳහා මෙම වාරිමාර්ග සහ ජල අපවහන ව්‍යුහයන්— වැව්, ඇල මාර්ග සහ ඇනිකට් නිසියාකාර පාලනය මෙන් ම නඩත්තු කළයුතු ය. නිසි ලෙස ක්‍රියාත්මක කෙරේ නම් වී කුඹුරු ගොවීන්ට අවදානමෙන් තොරව ජල පහසුකම් සැපයෙනු ඇත. මෙහි වී ගොවිතැන වෙනත් පහතරට තෙත් කලාපීය වී ගොවිතැනට වඩා අවදානම් රහිත වන අතර මෙම හේතුව නිසා පොල්පිටියේ ගොවියන් වැඩි දෙනෙක් තෙත් කලාපයේ පොදුවේ දක්නට ලැබෙන සරල වී ඉසීමේ ක්‍රමය වෙනුවට පැළ සිටුවීමේ ක්‍රමය දිගටම භාවිතා කෙරේ.

ඉහත කී ගම් තුනෙන් හැම ගමක් ම භෞතික පරිසරය අනුව අසාමාන්‍ය ලෙස පිහිටා තිබේ. එකී හැම ගමක් පරිසර පාලනයට සම්බන්ධ ප්‍රශ්න වලින් හෝ වඩා නිවැරදිව කියතොත් එක් ආවේණික ප්‍රශ්නයකින් යුක්ත වේ. වැලිගලගොඩ ගමේ ප්‍රශ්නය ගොඩ ඉඩම් හෙළි පෙහෙළි කිරීමට සම්බන්ධ වේ. වත්තේගම ප්‍රශ්නය වන්නේ වාරිමාර්ග සහ ජල අපවහන ක්ෂේත්‍රයේ සංරක්ෂන වැඩ කොටසක් කර ඇති සිවිල් ඉංජිනේරු සේවක මණ්ඩලය හා ගැමියන් අතර සම්බන්ධතාවය යි.

පොල්පිටියේ දක්නට ලැබෙන්නේ වාරිමාර්ග සහ ජල අපවහන ව්‍යුහයන් ගේ වැරදි පරිපාලනයකි. එක් එක් ගමෙහි තිබෙන ප්‍රශ්න විස්තර කිරීමට නොයෙදී, ප්‍රධාන තේමාවන් කිහිපයක් යටතේ ගම් මට්ටමේ පරිසරික පාලනයට සම්බන්ධ ව්‍යාප්ත වෙමින් පවතින, වැදගත් සහ අවධානය යොමු කළ යුතු ප්‍රශ්නයක් අප විසින් හඳුනා ගෙන ඇත. ඒ ප්‍රශ්නයන් එම ගම්වල විෂය අධ්‍යයන වලින් රැස් කර ගත් සාක්ෂි සහිතව ප්‍රශ්නයේ හැම අංගයක් ම අළලා පහත වෙන වෙනම සාකච්ඡා කරමු.

ගොඩ ඉඩම් වැසී ඇති වෘක්ෂලතාදිය.

කැලෑ හෙළි පෙහෙළි කිරීම ජාතික මට්ටමින් බලන කළ ඉතාමත් බැරෑරුම් සහ ක්ෂණික ප්‍රශ්නයක් වශයෙන් සැලකිය හැකි නිසා එම ප්‍රශ්නයෙන් ආරම්භ කිරීම යෙහෙකැයි හැඟේ. ජන සන්නිවේදන මාර්ග මගින් විශාල ප්‍රසිද්ධියක් ලබා දී ඇති අතර, කැලෑ ශුද්ධ කිරීමෙන් ස්වාභාවික පරිසරයේ ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල පිළිබඳව අවශ්‍ය තරම් තොරතුරු දැනට ලබා ගත හැකිව තිබේ.

විශේෂයෙන් ප්‍රධාන හේතූන් දෙකක් නිසා වැලිගලගොඩ කැලෑ හෙළි පෙහෙළි කිරීමෙන් පැන නැඟී ඇති ප්‍රශ්නය වඩා උග්‍ර ය. පළමුවන ප්‍රශ්නය වන්නේ සාමාන්‍යයෙන් මෙහි පවත්නා වැලි සහිත පස පහසුවෙන් තද වැසි මගින් බුරුල් වී සේදී යාමෙන් පසෙහි ඛනිජ ලවණ නැති වී යාම යි. 1940 ගණන් වල කැලය ශුද්ධ කරන විට දිරා පත් වූ පෛන්ද්‍රිය ද්‍රව්‍ය වලින් සෑදුනු වඩා සරු මතුපිට පසක් මතු විය. මෙහි වගා කරන අල වර්ගයන්හි රසවත් බව මින් සැතපුම් පහක් පමණ දුරින් පිහිටි අම්බලන්ගොඩ නගරයේ සෑහෙන ප්‍රසිද්ධියක් තිබුනි. මතුපිට පස නිසරු වැලි පස පමණක් ඉතිරි කරමින් ඉතා ඉක්මණින් සේදී ගොස් තිබේ. බොහෝ ගොවියන් තම ගොඩ ඉඩම්වල කුරුඳු වගා කර ඇත්තේ මෙම වැල්ලේ වෙනත් කිසිවක් වගා කිරීමට අපහසු හෙයිනි. කුරුඳු වගාව අනර්ථකාරී වේ. වාණිජ භෝග අතර පස විනාශ කෙරෙන වගාවක් ලෙස කුරුඳු වගාව සම කළ හැක්කේ හරියාකාර නඩත්තු නොකෙරෙන තේ වගාවට පමණි. වර්ෂා ජලයෙන් පස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කුරුඳු පඳුරෙන් ලැබෙන ආරක්ෂාව ඉතා අල්ප වේ. හොඳ අස්වැන්නක් ලබා ගැනීමට කුරුඳු පඳුර අතර වල් පැලෑටි සාමාන්‍යයෙන් වසරකට දෙවරක්වත් ඉවත් කළයුතු වේ. මේ නිසා පස සම්පූර්ණයෙන් අනාවරණය වේ. පොතු ගැනීමට කුරුඳු ගහ කපා ගැනීමේ දී කොළ සහ රිකිලි කපා පොළව මතු පිට දමයි. මෙයින් ගස් මුල්වලට සහ පොළවට ආවරණයක් ලැබෙන අතර, අවාසනාවන්ත ලෙස මෙසේ ඉවත ලන කුරුඳු කොළ එකතු කොට තෙල් ගැනීමට පිළිවෙලක් ඇතිවෙමින් පවතී.

වර්ෂාවට පස අනාවරණය වී තිබීමෙන් ආපදාකාරී ප්‍රතිඵල කිහිපයක් ඇති වේ. ගොඩ ඉඩම්වල යෝධ පාළුව වැලැක්වීමට කපනු ලබන කානු වැනි දේ ඉතා ඉක්මණින් පිරී යයි. ඉහත කී ක්‍රියාවලිය නතර කිරීමට ගන්නා උත්සාහයන් මේ නිසා අධෛර්යමත් වන අතර, සාමාන්‍යයෙන් පස සංරක්ෂණය පැහැර හැරේ. වර්ෂා ජලය සීඝ්‍රයෙන් පහළට ගල යාම හේතුවෙන් වර්ෂා දෙකක් අතර, කාලයේ දී ගොඩ ඉඩම් සීඝ්‍රයෙන් වියළී යාම සිදු වේ. මේ නිසා ගොඩ ඉඩම්වල එළවළු වගාවන් කිරීමට ලැබෙන්නේ ගොවියන් ටික දෙනෙකුට පමණක් වන අතර, ඉහළ ගොවියන් සම්බන්ධයෙන් මෙය විශේෂිත වේ. ජල හිඟය, ඛනිජ ලවණ හා පෛන්ද්‍රිය ද්‍රව්‍ය සේදී ගොස් ඉතිරි වී ඇති වැලි පස මෙහි එළවළු වගාව පවා අපහසු කරවයි. පැරණි ගැමියන්ට පැහැදිලි වම මතක ඇති පරිදි කැලෑ එළි පෙහෙළි කිරීමට ප්‍රථම මෙහි පස දැනට වඩා බොහෝ සරු වූ අතර, වරින් වර ඇති ජල හඟතාවය මෙතරම් බරපතල නොවීය.

ගොඩ ඉඩම් වලින් වේගයෙන් ජලය ගලා බැසීමේ ප්‍රතිඵල කුඹුරු වලින් වඩාම දැක ගත හැක.

කුඹුරු ඉතා ඉක්මනින් මහ වැසි වලින් පසු පිරී යයි. මෙසේ ජලය පිරී යාමේ භයානක ප්‍රතිඵල වැලිගලගොඩ ගමේ අඩු වුව ද, දිය පහර කෙළවරේ පිහිටි ගම්වල මහ වැසි වලින් පසු පිරී ගිය ජලය දින ගණනක් රැඳා පැවැතීමෙන් ප්‍රශ්නය උග්‍ර විය හැක. මුහුදු මට්ටමට ආසන්නව වැලිගලගොඩ ගම දෙපස පිහිටි පහත් කුඹුරු යායවලින් ජලය සීඝ්‍රයෙන් බැස යයි. ගම තුළ මහ වැසි මගින් භයානක ප්‍රතිඵල දෙකක් ඇති වේ. ගොඩ ඉඩම් වලින් වැලි සෑහෙන ප්‍රමාණයක් සේදී යන අතර, කුඹුරු තුළ ගොඩවල් වශයෙන් එකතු වෙයි. විශේෂයෙන් ම ඉහළ පිහිටි කුඹුරු ප්‍රධාන වශයෙන් වැලි පසින් හා ඉතා පටු මඩ සහිත වඩා සරු මුදුන් පසකින් යුක්ත ය. මෙවැනි පසෙහි පෝර ඉතා ඉක්මනින් සේදී යන අතර, මෙම ඉඩම්වල පසෙහි පෝර ප්‍රමාණය සාමාන්‍යයෙන් අඩු ය. සමහර ඉඩම් සම්පූර්ණයෙන් ම වී වගාවට නොසුදුසු ය. ඕනෑම කන්නයක දී සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් විස්සකටත් වඩා අඩු ඉතා පහළ මට්ටමක පවතී. ගොඩ ඉඩම්වලින් නික්ම කුඹුරු ඉඩම්වල තව තවත් වැලි තැන්පත් කරමින් සීඝ්‍රයෙන් ගලා යන ජල පහර කුඹුරු යාය දිගේ ඇති පිටවාන තුළ දී තවදුරටත් වේගවත් වේ. මෙහි දී එහි වේගවත් බවින් පිටවාන පිටාර ගැලීමට හෝ වේලි කැඩී යාමට ඉඩ හැරේ. මෙම ජලයෙන් කුඹුරුවල වටිනා මඩ සහිත මුදුන් පස සෝදා ගෙන සමහර විට පෝර, බීජ වී, මෙන් ම ඝුඩා වී පැල ද ගසා ගෙන යයි. මෙසේ ගලා ගෙන යන මුදුන් පස දැනටමත් රෛන්ද්‍රිය වර්ග ප්‍රමාණවත් නැතහොත් අතිරික්තයෙන් ඇති පහළ මට්ටමේ කුඹුරුවල තැන්පත් කෙරේ.

මුල් අවදියේ පැවති මට්ටමට මෙම තත්වය නඟා සිටුවීමට අපොහොසත් වනු ඇත. තාක්ෂණික වශයෙන් සලකා බලන කල මූලික ප්‍රශ්නය වන්නේ ගොඩ ඉඩම් කැලෑ වගාවට පමණක් නැතහොත් තෘණ හෝ සීමිත එළවළු වගාවන් සඳහා පමණක් යොදා ගත යුතු වීම ය. සර්ම කලාපීය වර්ෂා පතනයට මෙන් ම හිරු එළියට ද මුහුණ දීමට තරම් මෙම පස ශක්තිමත් නොවේ. එහෙත් සිය ගණන් මෙහි පදිංචිව ඇති අතර, රට ඉතා ආසන්නව අවතින් එළි පෙහෙළි කර මෙවැනි ඉඩම්වල පදිංචිව ඇති දහස් ගණන් මිනිසුන්ට වෙනත් විකල්ප මාර්ගයක් නොවේ. කෙසේ වුව ද, කැලෑ හෙළි පෙහෙළි කිරීමේ ප්‍රශ්නය මඳ වශයෙන් මඟ හැරීමට ඉඩකඩ තිබේ. සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට නොගන්නා ගොඩ ඉඩම් වලින් සෑහෙන කොටසක් මෙන් ම නිසරු කුරුඳු වගා සහිත මෙම ඉඩම් කොටස්වල ක්‍රමානුකූල පදනමක් මත කැලෑ රෝපනය කළහොත්, පස ඛාදනය, වර්ෂා ජලය සීඝ්‍රයෙන් ගලා බැසීම අඩු කිරීම ඍජු ම කුඹුරුවලට කාර්යක්ෂම ජල සම්පාදනයක් ඇති කිරීම වැනි ප්‍රයෝජන ගත හැක. ඊට අමතරව ගැමියන්ට දර සැපයීම මෙන් ම රට සමාන වැදගත්කමක් ඇති රෛන්ද්‍රිය ද්‍රව්‍යයන් හිඟයෙන් පෙලෙන මෙහි කුඹුරුවලට කොළ පෝර සැපයීම ද කළ හැක. කොළ වර්ග සහ තණ කොළ එකතු කිරීමෙන් පසෙහි සාරවත් බව වර්ධනය කෙරෙනු ඇති අතර, මතුපිට පස් තට්ටුවෙන් ඉක්මනින් රසායනික පෝර සේදී යාම වැළැක් වීමට උපකාරී වනු ඇත. ගොඩ ඉඩම්වල ඉහත කී ලෙස කැලෑ කොටස් නැවත වගා කිරීමෙන් කොළ පෝර සැපයීම, ගොඩ ඉඩම්වල පස ඛාදනය අඩු කිරීම, ජලය වඩා රඳවා ගැනීම, කැලයෙන් වැසුන ගොඩ ඉඩම් නිසා අඩු වන ජල ගැලීම්, නියඟ පවතින කාලවල කුඩා දිය පහරවල් වලින් නොකඩවා කෙරෙන ජල සැපයුම යන සතර ආකාරයෙන් වී වගාවට ප්‍රයෝජනවත් විය හැක. එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල මුල් භාගයේ වරින් වර ඇති වූ නියඟයන් ආශ්‍රයෙන් පෙන්වා දිය හැක්කේ වැලිගලගොඩ වැනි තෙත් කලාපීය ගම්මානවල මෙසේ කාලීනව ඇති වන ජල හිඟතාවයන් තවදුරටත් නොසලකා

සිටිය නොහැකි බව යි.

වර්ෂ දෙකක් අතර කාලයේ දී ක්‍රම ක්‍රමයෙන් කුඹුරුවලට ගලා යාමට ඉඩ හරිමින් වර්ෂා ජලය ගොඩ ඉඩම්වල රඳා ගැනීමක් නොපවතී. ජල හිඟතාවය වී අස්වැන්න කෙරෙහි බලපායි. කලට වේලාවට කුඹුරු පිළියෙළ කර ගැනීමට අපහසු වන අතර, විශේෂයෙන් ඉහළ අස්වැන්නක් ලබා දෙන කෙටි කාලීන වී සමඟ නියඟ කාලවල දී හානිකාරී වන වල් පැලෑටි පාලනය කිරීම අපහසු ය. තෙත් කලාපයේ පිහිටි පමණින් ම වාරිමාර්ග සැපයීමේ ප්‍රශ්නය නොනැගෙතැයි තවදුරටත් අපට උපකල්පනය කිරීමට අපහසු ය.

වැලිගලගොඩ තරමට ම කැලෑ හෙළි පෙහෙළි කිරීමේ ප්‍රශ්නය ඉතිරි ගම්මාන දෙකේ නොමැව ද ඒවායේ ද බලපෑම ඇති බව කිව හැක. වත්තේගම අවට කඳුවැටිවල වගා කෙරෙන තේ වගා වන් විශාල කොටසක් හරියාකාරව නඩත්තු නොකෙරේ. වැලිගලගොඩ කුරුඳු වගාව මෙන් ම මෙහි තේ ගසින් පසට ලැබෙන ආවරණය අල්ප වීමෙන් කඳුවැටිවල විශාල ලෙස පස ඛාදනය වන අතර ජලය සීඝ්‍රයෙන් පහතට ගලා යෑමත්, වැසි හිඟ වන විට වියළී යාමත් දක්නට ලැබේ. පසුගිය දශක කිහිපය තුළ කඳුවැටිවල සිට ගලා ගිය කුඩා දිය පහරවල් දැන් වියළී ගොස් ඇත. මෙය වී ගොවියන්ට එතරම් තදින් බල නොපාන්නේ ගම මැදින් ගලා යන ඇලෙන් වාරිමාර්ග පහසුකම් සැපයෙන බැවිනි. අප පහත පෙන්වා දෙන පරිදි කුඹුරු සියල්ලටම විශේෂයෙන් ගොඩ ඉඩම් වලට යාව පිහිටි කුඹුරුවලට, ඇලෙන් ජලය ලබා ගැනීම අපහසු වෙමින් පවතී. හරියාකාරව නඩත්තු නොකිරීම නිසා, සෝදා පාළුවට හසුවන තේ ඉඩම් වලින් ගසා ගෙන එන පස්, ගල් සහ සුන්බුන් කඳු පාමුල පිහිටි අපවහන අගල්, ඇලි තුළ හිරවී පසුව කුඹුරුවලට සේදී යාම මෙයට අඩ වශයෙන් හේතු වේ. මේ නිසා ගොඩ ඉඩම් ආසන්නවත් සහ ජල පහරට දුරිනුත් ඇති කුඹුරු වල මට්ටම උස් වී ඇත.

පොල්පිටියේ ගොඩ ඉඩම් බොහොමයක් පොල් වගාවෙන් වැසී ඇත. පරිසර විද්‍යාත්මක අංශයෙන් බලන විට පොල් ද රබර් මෙන් ම එතරම් හානිදායක නොවන වගාවක් සේ සැලකේ. පොල් අතු මට්ටමක ආවරණයක් සලසමින් වර්ෂාවෙන් සහ හිරු එළියෙන් පස ආරක්ෂා කරන අතර, ගස් අතර වැවෙන පැලෑටි සහ තෘණ මගින් තවත් මට්ටමක ආවරණයක් ඇති කෙරේ. හෙළි පෙහෙළි නොකරන ලද කැලෑවක ප්‍රමාණයටම පසෙහි තෙත් ගතිය රඳා ගෙන යාමක් මෙහි දී දක්නට නොලැබුන ද තේ සහ කුරුඳු සමඟ සසඳන විට වඩා හොඳ තත්වයක වේ. පස ඛාදනය වීමේ ප්‍රශ්නය ඉතා සීමිත ය. අභාග්‍යයකට මෙන් ගමෙන් උතුරු දෙසට පිහිටි සමහර කඳු බෑවුම් සහ මුදුන්වල පොල් වගාව සාර්ථක නොවේ. පස නිසරු වන අතර, ඉතා ඉක්මණින් වියළී යයි. ගැලපෙන එකම වගාව කුරුඳු වන අතර, ප්‍රතිඵල වැලිගලගොඩට බෙහෙවින් සමාන ය. වර්ෂා ජලය සීඝ්‍රයෙන් බැස යන අතර, මෙම කඳු වලින් ගලා එන දිය පහරවල වේගයෙන් ඒවායේ ඉවුරු තදින් ඛාදනය කෙරේ. එහි දෙපස විනාශ වී යන හෙයින් ආසන්නව පිහිටි පාරවල් සහ කාණු සහිත බේක්කු ශක්තිමත් කිරීමට සිදු වේ. කුඹුරුවල ජල ගැල්ම සිදු වේ නම්, එය බොහෝ විට සිදු වන්නේ ජලය බැස යන පිටවානේ විශාල බැම්ම දිය දහරවල බැස යන ජලයේ වේගයෙන් පුපුරා යාමෙනි.

වාරිමාර්ග අට ව්‍යුහයන් ගේ නඩත්තුව.

ශ්‍රී ලංකාවේ පරිසරය පිළිබඳව උනන්දුවක් දක්වන පාරිසරික විද්‍යාඥයින් ගේ අවධානය ප්‍රධාන වශයෙන් කැළෑ හෙළි පෙහෙළි කිරීමේ ප්‍රශ්නය කෙරෙහි යොමු වන සේම වාරිමාර්ග සම්බන්ධව සාක ච්ඡාවක දී මූලික ස්ථානය ගන්නේ වාරිමාර්ග ක්‍රමයන්හි නඩත්තුව යි. වර්ෂ ගණනාවක් නොසළකා හැරීමෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශයන්හි මෙම ප්‍රශ්නය උග්‍ර අවස්ථාවකට එළඹෙමින් පවතින බව පිළි ගත් කරුණකි. ඇත්තවශයෙන් ම මෙකී ප්‍රශ්නයන් සංඛ්‍යාවෙන් ඉතා අඩු ය. එකම ප්‍රශ්න නිතර මතු වේ. ප්‍රධාන ප්‍රශ්නය නම්, වාරිමාර්ග වැව් සහ ජල අපවහන ඇලවල රොන්මඩ ඉවත් කිරීමක් හෝ සැල්විනියා (පාවෙන පැලෑටියක්) ඉවත් කිරීමක් සිදු නොවීම; ඇනිකට් (උදාඃ ලෑලි) සහ ස්ලුවිස් උපකරණ සොරකම් කිරීම හෝ අලාභ හානි කිරීම, වැව් බැම්මවල ඇති වන පිපිරීම් අළුත් වැඩියා කිරීමට අපොහොසත් වීම, කාර්යක්ෂම ජල පරිපාලන වැඩ සටහනක් සංවිධානය කිරීමට අපොහොසත් වීම.

මෙවැනි ප්‍රශ්න වලින් අප ගේ අධ්‍යයන ගම්මාන සියල්ලකම තිබේ. ජලය සැපයීම සම්බන්ධව කොපමණ දුරට ගොවියා පොදු වැවෙන්, ඇලවල් හා ඇනිකට් වලින් යැපෙනවා ද යන්න මත ප්‍රශ්නයේ බැරෑරුම්කම රඳා පවතී. සාමාන්‍යයෙන් වාරිමාර්ග ව්‍යුහයක් ඇති වැලිගලගොඩට එම ප්‍රශ්නයන් ඉතා අඩුවෙන් බලපායි. ජලය බෙදා හැරීමේ ක්‍රමයේ ඉතාම වැදගත් අංශය වන්නේ කුඹුරු අද්දර පිහිටි පිටවාන වන අතර, පවිත්‍ර කිරීමේ කටයුතු එයට යාව පිහිටි කුඹුරුවල ගොවීන් පෞද්ගලික පදනමක් මත කර ගෙන යනු ලබයි. පොල්පිටිය ජලය බෙදා හැරීමේ පොදු ව්‍යුහයක් මත බෙහෙවින් යැපෙන අතර, නඩත්තුව සම්බන්ධයෙන් අඩුපාඩුකම් මෙහි තදින් බලපායි.

පොල්පිටියේ ජලය සැපයීමේ ක්‍රමය සාර්ථකව පාලනය කෙරුණ අවධියක් පිරික්සීමට අපට සෑහෙන කාලයක් ආපස්සට ගමන් කිරීමට එනම් එය රජයෙන් පත් කරන ලද වාරිමාර්ග ප්‍රධානියකු වූ වෙල්විදානෙවරයකු ගේ වගකීමව පැවැති කාලයට යාමට සිදු වෙයි. ගොවියන් ගේ විශ්වාසය වන්නේ මෙම කටයුතු මෙකල හොඳින් පාලනය වූ අතර, 1958 දී වෙල් විදානෙ ක්‍රමය ඉවත් කොට ගොවියන් අතරින් පත් කර ගත් ගොවි කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු ක්‍රම ක්‍රමයෙන් අභාවයට යාමට පටන් ගත් බව යි.

පොල්පිටියේ ඇති බරපතලම ප්‍රශ්නය වන්නේ ජල මට්ටම ඉහළ නගින අවස්ථාවල ලවණ ජලය කුඹුරු වලට ඇතුළු වීමෙන් වැළැක්වීමට යොදා ඇති ඇනිකට් හරියාකාර පාලනය නොකිරීම වේ. කාර්යක්ෂම භාවිතයට නම් මෙම ඇනිකට් වඩදිය ආරම්භයට පෙර, ලවණ දිය කුඹුරුවලට ඇතුළු වීම වැළැක්වීමට වැසීමත්, බාදිය පවතිද්දී කුඹුරු වලින් පිට වන අපවහන ජලය බැස යාමට විවෘත කිරීමත්, ක්‍රමිකව නියමිත වේලාවට කළයුතු ය. වෙල්විදානෙ ක්‍රමය අහෝසි කිරීමෙන් පසු ඇනිකට් වලට අප්‍රමාද සහ ක්‍රමික අවධානය නොලැබුණු බව පෙනේ. ගඟට ආසන්න සමහර කුඹුරු ලවණ දිය නිසා වගා කළ නොහැකි තත්වයට පත් වේ. ඒවා අත්හැර දමන ලදී. එහි ප්‍රතිඵල යක් ලෙස මෙම ස්ථානයේ ජල අපවහන ඇලවල් පවිත්‍ර කිරීමට කිසිවකු නොවූ අතර, ඇනිකට්

හරියාකාර පාලනය කිරීමට ඇති බැලපෑම අඩු විය. මෙය වාරිමාර්ග පරිහානයක විෂමාවක්‍රයේ ආරම්භය විය. කුඹුරු අත්හැර දැමූයෙන් ඇතිකට් හා ජල අපවහන ඇල මාර්ග ශුද්ධ කිරීම කෙරෙහි අවධානය අඩු කෙරිනි. ලවණ දිය තව තවත් ආක්‍රමණයක යෙදුන අතර, වඩ වඩා ඉඩම් අත්හැර දැමුණි. මේ අන්දමට දැනට ලවණ දිය බලපෑ කුඹුරු අක්කර හැටක් පමණ දක්නට ලැබේ. ඉන් වැඩි ප්‍රමාණයක් දැනටම අත්හැර දමා ඇත. ජල මට්ටම පහළ බසින විට ධෛර්ය සම්පන්න ගොවියන් කිහිප දෙනෙකු වගා කිරීමට උත්සාහ දැරුව ද, අස්වැන්න දුර්වල වීම සහ සම්පූර්ණ වගා පාඩුව නිතරම ඇති වෙයි. ලුණු දිය ආක්‍රමණයේ ප්‍රතිඵල පැළෑටිලට පෙනී යයි. ඉහත කී හේතුවෙන් යාය පහළ අන්තයේ පිහිටි ජල අපවහන ඇල මාර්ග නොසළකා හැරීම නිසා තද වැසි වලින් ඉහළ කොටස්වල පිරී යන අතිරික්ත ජලය ඉවත් කිරීම අපහසු වේ. ඇල වල් පටු වී පැළෑටි වලින් පිරී ඇත. යාය ඉස්මත්තේ මුලින් ජලය හොඳින් බැස ගිය කොටසක් දැනට ස්ථිර වගුරු බිමක් බවට පත්ව ඇත. ජල මට්ටම බෙහෙවින් ගැඹුරු නම් ඉඩම් කිසිසේත් ම වගා නො කෙරේ. වගා කළ අවස්ථාවල දී වුව අස්වැන්න පහළ මට්ටමක පවතී.

ජල අපවහන ක්‍රමවල පරිහානිය පොල්පිටියේ වී ගොවියන් මුහුණ පාන එකම ප්‍රශ්නය නොවේ. දුර්වල වෙමින් පවතින ජල අපවහන හා වාරිමාර්ග ජල සැපයුම යන ද්විත්ව ප්‍රශ්නයන් ගෙන් ඔවුන් මිරිකී යයි. වෙන ඕනෑම ස්ථානයක මෙන් මෙහි යාය ඉස්මත්තේ වාරිමාර්ග ජලාශය වෙල් විදානේ යටතේ පාලනය වූ අතර, ඔහු ගේ සුපරීක්ෂාව යටතේ හැම කන්නයක් ම ආරම්භ යට පෙර වගාකරුවන් රැස්වීමක් පවත්වා වැවෙන් ජලය නිකුත් කිරීම සම්බන්ධ දින නියම කර ගන්නා ලදී. බිම් සකස් කිරීම එකම දිනවල පටන් ගන්නා ලද අතර, කුඹුරෙන් කුඹුරට ගලා යද්දී වැව් ජලයෙන් උපරිම ප්‍රයෝජනය ගන්නා ලදී. මෙසේ මුල් බැස ගත් ක්‍රියාවලින් ගොවි කාරක සභා ක්‍රමය යටතේ මඳින් මඳ අභාවයට යාමට ඉඩ හරින ලද බව පෙනී යයි. වගා කරුවන් ගේ රැස්වීම් පළමුවෙන් ම අත්හැර දමන ලදී. පසුව ගොවි කාරක සභාවේ සභාපති හෝ ලේකම් විසින් ජලය මුදා හරින දිනයන් පිළිබඳව වැඩ සටහන් සකස් කිරීම කර ගෙන යන ලදී. ඒ අයුරින් ම මෙම ක්‍රමය ද අභාවයට ගියේ ය. ඇල දොරටුවේ යතුර භාරව සිටින ගොවි කාරක සභා සාමාජිකයාට ඇති පුද්ගලික උපකාරය මත පමණක් ජලය ලබා ගැනීමට හැකි යයි දැන් පැවසේ. බොහෝ ගොවියන් තුළ වැව් ජලය කෙරෙහි ඇති විශ්වාසය දැන් කඩවෙමින් පවතී. අඩක් මෙහි ප්‍රතිඵලය වශයෙන් ද අඩක් මෙහි හේතුව ලෙසයෙන් ද, ගොවියන් එකිනෙකා පිළිගත් වගා කාලයකින් තොරව, වගා කටයුතු කරන්නට විය. මෙනිසා ජල සැපයුම එක විටම සියළු දෙනාටම අවශ්‍ය නොකෙරෙන අතර, එම හේතුවෙන් වඩා හොඳ ජල පාලනයක් සම්බන්ධව සමූහ බලපෑමක් ද ඇති නොකෙරේ. ඉතාම හොඳ ක්‍රමය වූ පැරණි ක්‍රමය නැවත ඇති කළ හැක්කේ ගොවියන් නැවත පොදු වගා වැඩ සටහනකට බල කිරීමට සංවිධානය සහ විනය වැනි අවශ්‍යතා තිබුව හොත් පමණි.

රජයේ මැදිහත්වීම.

පසුගිය අවුරුදු තිහක පමණ කාලයක් තුළ සුළු වාරිමාර්ග සහ අපවහන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු වැදගත් වෙනස්කම් වලින් එකක් වන්නේ රජයේ ආයතනයන් ගේ වැඩි වැඩියෙන් මැදිහත් වීම යි. මෙම මැදිහත් වීම මූලික වශයෙන් දෙයාකාර වේ. මුල දී ප්‍රාදේශීය සුපරීක්ෂා අධිකාරිය වූ වෙල්විදානේ ක්‍රමය වෙනුවට වඩ වඩා රජයේ ආයතනයක සුපරීක්ෂාව යටතේ වන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂාව යටතේ වන ගොවි කාරක සභා (පසුව ගොවි කාරක සභා සහ කෘෂිකර්ම පලදාව වර්ධන කමිටු ඉතා මෑත දී වගා නිලධාරීන්) ක්‍රමය පළමුවෙන් ම පිහිටුවන ලදී. රජයේ දීමනා මත රජය විසින් පත් කළ ද, 'වෙල්විදානේ' අඩු සුපරීක්ෂාවක් යටතේ ක්‍රියා කළ අතර, විධිමත් ක්‍රියා පටිපාටීන් ගෙන් සහ රජයේ නිලධාරීන් ගේ බලය නොලබා ප්‍රදේශයේ තමනට හිමි වන සමාජ සහ ආර්ථික තත්වය තුළින් රාජකාරි කටයුතු කිරීමට පිටුවහලක් වීම සඳහා සමාජයේ ඉහළ පන්ති තුළින් පත් කරන ලදී. ඉතා මෑතක් වනතුරු සුළු වාරිමාර්ග සහ ජල අපවහන සම්බන්ධව ප්‍රාදේශීය පරම වගකීම තේරී පත් වූන (පසුව පත් කරන ලද) ගොවි ජන නියෝජිතයන් වෙත පැවරුව ද අධිකාරි ධූරාවලිය වඩා විධිමත් වී තිබේ. දෙවන ප්‍රධාන වෙනස්වීම වන්නේ රජයේ ආයතන ඉදිකිරීම් කටයුතුවල දී වඩ වඩා මැදිහත් වීම ය. ඇලවල් හෑරීම, ඇනිකට් සෑදීම වැනි කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදනය කර ඇත. සමහර අවස්ථාවල ඉදි කිරීම් කටයුතු සෘජුවම රජයේ ආයතන මගින් කර ඇත ද, අපේක්ෂිත ක්‍රමය වන්නේ සියළු ම සුළු ඉදිකිරීම් කටයුතු ගොවි කාරක සභා, පලදාව වර්ධන කමිටු, ග්‍රාම සංවර්ධන සමිති හෝ සමූපකාර සමිති වැනි ප්‍රාදේශීය සංවිධානවලට කොන්ත්‍රාත් දීම යි.

සුළු වාරිමාර්ගයන්හි වඩ වඩා රජයේ මැදිහත් වීම නිසැකව ම පලදායි ප්‍රතිඵල ගෙන දී තිබේ. කොන්ක්‍රීට් ඇනිකට් භාවිතයෙන් ගොවියන් වැඩි දෙනෙකුට ප්‍රයෝජන අත් වේ. මෙහි වෙනත් අංශයක් ද ඇති අතර, අප ඒ වෙත අවධානය යොමු කරමු. සුළු වාරිමාර්ග හා ජල අපවහන වැඩ වල දී රජයේ සහභාගීත්වයේ ස්වභාවය අනුව ප්‍රධාන ගැටළු තුනක් මතු වේ. පළමුවැන්න අති විශාල ප්‍රමාණයක් කොන්ක්‍රීට් ඉදි කිරීම් වේ. කොන්ක්‍රීට් ව්‍යුහයන් විශේෂයෙන් ම ඇනිකට් බොහෝ විට අනවශ්‍ය ස්ථානවල ගොඩ නඟා ඇති අතර, ඒවායේ ප්‍රයෝජන ද සීමිත ය. වත්තේගම හොඳ උදාහරණයකි. නිම්නය දිගේ ගලා යන ඇලෙන් (ඇල්ලෙන්) බොහොමයක් ම කුඹුරු වලට ජලය ලබා ගනී. මුල් අවදියේ ජල මට්ටම ඉහළට නංවා ගන්නා ලද්දේ ලී, කෙසෙල් කඳන් සහ කොළ උපයෝගී කර ගෙන තාවකාලිකව තනා ගන්නා ලද ඇනිකට් මගිනි. මේවා ගොවියන් විසින් ම ඉදි කර ගන්නා ලදී. වත්තේගම පමණක් විස්සකට නොඅඩු ප්‍රමාණයක් එවැනි ඇනිකට් තනා ගන්නා ලදී. මේවා බොහෝ දුරට සපලදායි වූ බව පෙනේ. මේවා ගොඩ නැඟීම ලාභ මෙන් ම පහසු වූ අතර නම්‍ය ඉදි කිරීම් වේ. කන්නයෙන් කන්නයට ඉදි කෙරෙන ස්ථානය වෙනස් කළ හැකි අතර, අදාළ ගොවියනට ගැලපෙන පරිදි ඉදි කිරීමේ කාලය යොදා ගත හැකි විය. කෙසේ වුව ද, එවැනි ඇනිකට් දැනට භාවිතා නොකෙරේ. දෙවන ලෝක යුද්ධය ආසන්නයේ දී මේවා වෙනුවට විශාල ඇනිකට් පහක් ඉදි කරන ලදී.

මෙම වෙනස් කිරීම සම්පූර්ණයෙන් සාර්ථක වී නොමැත. ගංවතුරෙන් කොටස් ලෙස හෝ සම්පූර්ණයෙන් විනාශ වීම නිසා කොන්ක්‍රීට් ඇනිකට් තුනක් ම ප්‍රයෝජනයට ගත නොහැක. ඇනිකට් එක නිසා තමන් ගේ කුඹුරු යට වී ගිය ගොවියන් විසින් අඩුම වශයෙන් මෙයින් එකක් හිතාමතාම විනාශ කර තිබේ. කොන්ක්‍රීට් ඇනිකට් සංඛ්‍යාව අඩු වී ඇති නිසා දැන් ඇනිකට් එකකින් ප්‍රදේශයකට සේවය සැපයීමට සිදු වී ඇති අතර, මේවා ක්‍රියාත්මක වන්නේ ජලය පිරී යාමෙන් පමණක් නිසා ඈත පිහිටි කුඹුරුවලට අවශ්‍ය පමණ ජලය ලඟා වීමට ප්‍රථම ඊට ආසන්නයේ පිහිටි කුඹුරු පිරී යයි. මුල දී තිබූ තාවකාලික ලී ඇනිකට් මෙන් නොව, මේවා කොන්ක්‍රීට් ඇනිකට් සහුරකු මෙන් ම මිහුරකු වශයෙන් ද කටයුතු කරයි. වත්තේගම මෙන් ම වෙනත් ඕනෑම ස්ථානයක හිතාමතා කොන්ක්‍රීට් කඩා නොදැමුව ද, ජල ගැලීම් අවස්ථාවල දිය පහරේ වේගයට ඒවා ගැලවී යයි. නිතර විශාල ජල ගැලීම් ඇති වන ප්‍රදේශයක මෙය මඟ හැරවීම අපහසු ය. තාවකාලික ලී ඇනිකට් එකක් සෝදී යාමෙන් ඇති වන අලාභය අල්ප වේ. කොන්ක්‍රීට් ඇනිකට් එකක් කැඩී යාමේ දී විශාල මුදල් ප්‍රමාණයක් නාස්ති වී යනවා මෙන් ම නැවත පිහිටුවීමට අවුරුදු ගණනක් ගත වන අතර, එම කාලය තුළ ගොවියාට පැරණි ක්‍රමයේ පිහිට පැතීමට සිදු වේ. අප ගේ නියැදි ගම්මාන තුළ කොන්ක්‍රීට් ඇනිකට්වල අත්‍යවශ්‍ය නොවන බව කැපී පෙනෙන්නේ ඉන් බොහොමයක් ම බලාපොරොත්තු වූ කරුණ සඳහා ප්‍රයෝජනයට නොගැනීමෙනි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ ජලය රැඳවීමට යොදා ගන්නා ලෑලි හැමෙකකම වාගේ අතුරුදහන් වීම ය. පාවිච්චි නොකරන අවස්ථාවල දී මෙම ලෑලි ගොවි කාරක සභා සාමාජිකයකු විසින් ආරක්ෂා කර ගැනීමට බලාපොරොත්තු වේ. ඒවා නැති වී යාමෙන් කරුණු කිහිපයක් ඉස්මතු වේ. මෑත දී ඉවත් කරන ලද ගොවි කාරක සභා/පලදාව වර්ධන කමිටු ක්‍රමයේ දුර්වලත්වය, එසේම මේවා වටිනා ලී කොටස් වන හෙයින් සුළු සොරකම් වලට ඉලක්කය වීම, ගොවියන්ට මේවා නොමැතිව කටයුතු කර ගැනීමට පිළිවන් වීමෙන් ඒවා ආරක්ෂා කිරීමට වැඩි උත්සාහයක් නොගැනීම සහ නැවත දම්මවා ගැනීමට වැඩි ප්‍රයත්නයක් නොදැරීම, ප්‍රධාන කරුණු වෙයි. බොහෝ අවස්ථාවල කෙසෙල් කොට සහ කොළ නියමිත කාර්ය හරියාකාරව කරන බව පෙනේ. මෙම විශ්ලේෂණයෙන් නිතැතින් ම පැන නඟින ප්‍රශ්නය වන්නේ එසේ නම් කොන්ක්‍රීට් ඇනිකට් සෑදුවේ මන්ද යන්න යි. මෙයට පක්ෂ තුනක් සම්බන්ධ වනු දක්නට ලැබෙන අතර, එකිනෙකට වෙනස් එහෙත් හොඳින් අවබෝධ කර ගත හැකි හේතූන් දක්නට ලැබේ. කොන්ක්‍රීට් ඇනිකට් සෑදීම සම්බන්ධව වැඩි පරිශ්‍රමයක් නොදැරුව ද, ගොවියන් එවැනි යෝජනාවන්ට යම් අයුරකින් උපකාරී වේ. තාවකාලික ඇටවුම ව්‍යුහයන්ට වඩා කාර්යක්ෂම භාවය පිළිබඳව ඇනිකට් ස්ථිර විශ්වාසී බවක් පෙන්වන අතර, හැම කන්නයේ ම තාවකාලික ඇනිකට් නැවත නැවත ඉදි කිරීමෙන් තොරව යම් තාක් දුරට ශ්‍රමය ඉතිරි කරයි. ඉදි කිරීම් භාර ගන්නා කොන්ත්‍රාත්කරුවන්ට වඩා යහපත් ප්‍රතිඵල ලැබෙන බව පෙනී යයි. ඔවුන් ගේ දෝෂ සහිත ඉදි කිරීම් කටයුතුවල ප්‍රතිඵලය වශයෙන් ව්‍යුහයන් දුර්වල වීමෙන් ගංවතුරෙන් විනාශ වී යයි. මෙහි දී සම්බන්ධ වන අනික් පක්ෂය වන්නේ රජය යි. රජයේ ආයතනවල අරමුණු ඒවා අනුගමනය කරන ක්‍රියා පිළිවෙල නිසා කොන්ක්‍රීට් ව්‍යුහයන් සම්බන්ධව වැඩි කැමැත්තක් දක්වයි. ප්‍රතිඵල ඍජුවම පෙනී යාම මුල් ම කරුණය. දෙවන කරුණ මේවා සැහැදිලි කුඩා [illegible] වන අතර, උදාහරණයක් ලෙස විශාල පරිමාණයේ ව්‍යාපාරයන්ට වඩා කටයුතු භාර

ගැනීම පහසුය. අදාළ වන දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු කාර්යාංශවල එවැනි දක්ෂතා යෙදවීමට මාර්ගයක් වීම තුන්වන කරුණ ය. මෙම දක්ෂතා මූලික වශයෙන් ඉදි කිරීම් සම්බන්ධව වන අතර, මෙම කාර්යාංශවලට කළමණාකරණය පිළිබඳව ප්‍රශ්න වැඩි අවධානයක් දීමට පුහුණුවක් නොමැත. තනි තනිව ගත හොත් ඉහත කී බලපෑම් ප්‍රබල නොවේ. එහෙත් එකට ගෙන විශේෂිත ව්‍යාපාරයක සම්බන්ධව බලන විට වැදගත්කම වැඩි වන අතර, මුදල්මය හා භිත සම්පතක් ලෙස සිමෙන්ති සම්බන්ධව බලන විට උග්‍ර අවශ්‍යතාවයන් සඳහා යෙදවී ඇතැයි කිව නොහැක.

සුළු වාරිමාර්ග සම්බන්ධව රජයේ මැදිහත් වීමේ ප්‍රතිඵලයන්හි දෙවෙනි කරුණ පසුගිය ඡේදයෙන් ඉස්මතු වන කරුණු වලට කිට්ටුවෙන් සම්බන්ධ වේ. මෙය මූලිකව වශයෙන් ව්‍යාපාර හඳුනා ගැනීම පිළිබඳව ශිල්පීය වශයෙන් සුදුසුකම් ලද රජයේ නිලධාරීන් හා ප්‍රදේශය සම්බන්ධව ඉතා ප්‍රයෝජනවත් දැනුමක් ඇති ගොවියන් අතර, හරියාකාර අදහස් හුවමාරුවක් ඇති වීමට ඉඩ නොතැබීම යි. ඇමුනීන් වැව්, ඇලවල් සහ ඇනිකට් අවශ්‍ය ද එවා පිහිටුවිය යුත්තේ කොහි ද, යන්න පිළිබඳව දෙපක්ෂයට ම ප්‍රයෝජනවත් අදහස් ඇත. අවාසනාවන්ත හේතූන් කිහිපයක් නිසා මෙම අදහස් හුවමාරු නිතරම සිදු නොවන බව පෙනේ. අදහස් මතු කිරීමට හා සාකච්ඡා කිරීමට කාර්යක්ෂම ගොවි සංවිධාන නිග වීම එක කරුණකි. අනෙක ඒකමතික සහයෝගයක් නො ලැබෙන යෝජනා ගෙන නොඒම දෝෂාරෝපනයට ලක් විය යුතු ය යන හැඟීම යි. එවැනි බලාපොරොත්තු බොහෝ විට අතාත්වික යි. කුඹුරු යායේ එක් පසෙක ඇති පිටවාන ගැඹුරට හාරා, සුදු කළහොත් එය එක්ස් සහ වයි කියන පුද්ගලයින්ට ප්‍රයෝජනවත් වනු ඇති අතර, එම කාර්යයම යායේ අනෙක් පස සිදු කළහොත් පී සහ කියු යන පුද්ගලයින්ට වඩා ප්‍රයෝජනවත් වනු ඇත. පුද්ගලයෙකු ඇනිකට් එකක් එක් තැනක අවශ්‍ය වන අතර, තවෙකකු ඊට යාර සියයක් පහළින් ප්‍රයෝජනවත් යයි සිතයි. පොදු ප්‍රයෝජනය සඳහා ඇලක් පුළුල් කිරීමට අවශ්‍ය වූ විට එහි ප්‍රතිඵලය ලෙස තම කුඹුරෙන් අඩි දෙකක පටියක් නැති වීමට ඉඩ ඇති ගොවියා ගේ සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු වීම උදක් ම අපහසු ය.

වී වගාව තුළ විශේෂයෙන් ම ජල පාලනය පිළිබඳව කටයුතුවල දී පුද්ගලයන් අතර රැස්කම් පිළිබඳව ගැටුම් ඇති වීම ආවේණික කරුණකි. ගැමියන්ට තම ප්‍රදේශය පිළිබඳව මනා අවබෝධයක් ඇත. උදාහරණයක් විදියට වැඩි ජලය ගලා යන්නේ කොහිද එහෙයින් ඔවුන්ට අපහසුතා ඇති නොවන්න ට ඇනිකට් පිහිට විය යුත්තේ හෝ නොවිය යුත්තේ කොහිද යන්න, බොහෝ විට ඔවුන්ට යෝජනා කළ හැක. ගැමියන් අතර පවතින අදහස්වල පරස්පර විරෝධී භාවය හේතුවෙන් තාක්ෂණික නිලධාරීන් ගැමියන් ගේ අදහස් උදහස් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීමට නැමියාවක් තිබෙන බව පෙනේ. සමහර අවස්ථාවල ඔවුන් (නිලධාරීන්) දේශපාලනඥයින් මඟින් යටපත් වන අතර, ඔවුන් ගේ වෘත්තීමය තීරණවලට පටහැනි විදියේ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමට බල කෙරේ. උදාහරණයක් වශයෙන් මෑතක දී ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයට දේශපාලන බල කිරීම් මත වත්තේගම ආසනයේ අත්‍යවශ්‍ය නොවූ ගොඩ ඉඩම් වාරිමාර්ග ජලාශයක් ඉදි කිරීමට සිදු වුව ද,

විධිමත් ලෙස විවෘත කිරීමෙන් පසු පුරා වසරකට අධික කාලයක් ගතවීත් ඇළවල් මගින් එය කුඹුරු සමඟ සම්බන්ධ කිරීමට උත්සාහයක් දරා නැත. ස්වාභාවිකව බලාපොරොත්තු විය හැකි පරිදි නිලධාරීන් වෘත්තීමය නොවන පුද්ගලයින් ගේ අදහස් උදහස් අවඥාවෙන් දැරීමට සහ වාරිමාර්ග ව්‍යුහයන් ඉදි කිරීමෙන් පසුව තමන්ට ඒ සම්බන්ධව කිසිම වගකීමක් නැති බව සාඩම්බරයෙන් ප්‍රකාශ කිරීමට පෙළඹෙති.

ඔවුන් ගේ අදහස් මෙසේ උපුටා දැක්විය හැක. 'ව්‍යාපෘතියේ වැඩ නිම වූ පසු අපි යතුරු පලදා වර්ධන කමිටුවේ සභාපතිට භාර දෙනවා. අපේ වගකීම එතැනින් අවසාන යි'. වැඩි ප්‍රයෝජනයක් නොමැති කොන්ක්‍රීට් ඇනිකට් තවදුරටත් ඉදි කිරීමට හේතුව මෙයින් තේරුම් ගත හැක. මෙම අවස්ථා දෙකට සම්බන්ධව ආයතන අතර කිසිදු සහයෝගීතාවයක් නැත. මෙවැනි ප්‍රශ්න පහසුවෙන් විසඳිය හැකි යයි බලාපොරොත්තු වීම යථාවබෝධ නොවේ. ගොවියන් විසින් තමන් තාක්ෂණික නිලධාරීන්ට වඩා කාර්ය කළයුතුව තිබුනේ කෙසේ ද යන්න දන්නා බව නිතරම පැමිණිලි කරනු ඇත. කෙසේ හෝ ව්‍යාපාරයක් සම්බන්ධව අවසාන තීරණ ගැනීමට ප්‍රථම ගොවි සමිති සමඟ වඩා විධිමත් උපදේශ සම්බන්ධ සාකච්ඡා පැවැත් වූයේ නම්, මෙයට වඩා බොහෝ යහපත් ප්‍රතිඵල ලැබීමට ඉඩ තිබුණි. විවිධ ගොවියන් පරස්පර විරෝධී අදහස් දරන්නේ මන්ද යන්න විමසා බැලුවේ නම් තාක්ෂණික නිලධාරීන්ට වෛකල්පිත යෝජනා සම්බන්ධ වඩා පුළුල් අවබෝධයක් ලබා ගැනීමටත්, ඒවා අතරින් තීරණ ගැනීමටත් අවස්ථාවක් තිබුණි. අනෙක් අතට ගොවියන්ට තමන් ගේ ප්‍රයෝජනය සඳහා කෙරෙන සියලු ම වාරිමාර්ග හා ජල අපවහන කටයුතුවල කිසියම් ප්‍රමාණයකින් මුදල් හෝ ශ්‍රමය යෙදීමට සිදු වී නම්, යෝජනා සිතා මතා කිරීමට පෙළඹෙනු ඇති අතර, විවිධ යෝජනාවල වියදම් සහ ප්‍රයෝජනයන් ගේ වෙනස්කම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත.

මෙම උපකල්පනයෙන් සුළු වාරිමාර්ග සහ අපවහන කටයුතුවල රජයේ මැදිහත් වීම සම්බන්ධව අප ගේ තුන්වන අදහස කෙරෙහි යොමු කෙරේ. එනම් ක්‍රමික නඩත්තු කටයුතු සම්බන්ධයෙන් රජය කෙරෙහි ගොවියන් වඩ වඩා යැපෙන්නට වීම යි. ගොවියන් විසින් කෙරෙන සියලු ම පැමිණිලි වලින් වැඩි කොටසක් මහත් උත්සාහයකින් තොරව එහෙත් යම්කිසි ප්‍රමාණයක සංවිධානාත්මක ස්වරූපයකින් ගොවියන් විසින් ම විසඳා ගත හැක. ඇළවල් ශුද්ධ කිරීම, වැව්වල සැල්වීනියා පැළෑටි ශුද්ධ කිරීම, ඇළවල් සෘජු කොට සකස් කිරීම, කුඩා ඇනිකට්වලට ලෑලි දැමීම සහ ආරක්ෂා කිරීම මේවා අතර වෙයි.

## ආරවුල් සහ ගැටුම්.

මෙහි වෙනත් තැනක පෙන්වා දෙන පරිදි ගොවියන් අතර සුළු වාරිමාර්ග සහ ජල අපවහනය කටයුතු සම්බන්ධව විරුද්ධතා වැලැක්වීමට නොහැකි වන අතර, මෙය ගොවියන් පුද්ගලික අභිමතාර්ථ යන් සපුරා ගැනීමට කටයුතු කිරීමේ ස්වභාවික ප්‍රතිඵලයකි. ගොවියන් ගේ චර්යා බොහෝ දුරට තාර්කික ය. ගොවීන් අතර සමගිය ඉතා අඩු බැවින් ගොවි අසමගීන් සැලකිල්ලට ගෙන ගොවි සංවිධාන සහ ගොවි නිලධාරි අන්තර් සම්බන්ධතා ඇති වන විදියේ වැඩ පිළිවෙළවල් සකස් කිරීම වඩා යහපත් ය. වගා ආරවුල් සම්බන්ධයෙන් බලන විට ද ඉහත දක්වන ලද විශ්ලේෂණය බෙහෙවින් අදාළ වේ. සාමාන්‍යයෙන් වගාවේ දී විශේෂයෙන් වී වගාවේ දී ගොවියන් අතර ඉතා කිට්ටු අන්‍යොන්‍ය සම්බන්ධයක් පවතී. මේ නිසා ම ආරවුල් ඇති වීමට ඇති අවස්ථා ඉමහත් වේ. පිටස්තරයෙකුට මෙම ආරවුල් පෙනෙන්නේ සුළු දේ වශයෙනි. එහෙත් වගාකරුවාට එය එසේ නොවේ. මේ සම්බන්ධව රජයේ අවධානය යොමු කිරීම වැදගත් වන්නේ ආරවුල් විසඳීමට සහ යුක්තිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ප්‍රාදේශීය සංවිධාන නැති වීම කෘෂිකර්මය කෙරෙහි ආපදා ප්‍රතිඵල ගෙන දෙන සුළු බව අපගේ විෂය අධ්‍යයන වලින් පෙනී යන හෙයිනි. පොල්පිටියෙන් උදාහරණ කිහිපයක් ගෙන බලමු. වාරිමාර්ග පද්ධතිය දුර්වල පාලනය කිරීම හැරුණු විට පසුගිය වර්ෂයේ හෝ ඊට පෙර මවු ජලාශයෙන් ජලය නොලැබීම නිසා ජලය බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය බොහෝ දුරට අඩු වී ගොස් ඇත. ප්‍රධාන වැව් ඉවුරෙහි මැණික් ගැරීම විශාල ව්‍යාපාරයකට හැරී ඇති අතර, එයට පහසු වන ලෙස ජලය පහළ මට්ටමක පවත්වා ගැනීමට මැණික් ගරන්නන් විසින් ජල පාලන දොර නිතරම හැර තිබීම මෙයට හේතු වී ඇත. බාහිර උපකාරයක් නොමැතිව ගොවියන්ට කිසිවක් කර කියා ගත නොහැක. ක්ෂේත්‍ර ඇලවල් බොහොමයක් ම ඒවායේ කාර්යක්ෂමතාවය අඩු වන පරිදි පටු වී ඇත. මෙයට හේතුව ඇලට යාබද කුඹුරු හිමියන් තම කුඹුරු විශාල කර ගැනීමේ අදහසින් ඇලට අයත් කොටස් ටිකින් ටික අල්වා ගැනීමයි. මුළු ගොවි ප්‍රජාවම මින් කරදරයට පත් වේ. එක් ධනවත් ගොවියකු තම වැඩි වතුර කිසිවක් කර කියා ගත නොහැකි අනෙක් ගොවියන් ගේ කුඹුරු හරහා නිතරම ගලා යාමට සැලැස්වීම නිසා ඔවුන් ගේ කුඹුරු වලට අලාභ හානි සිදු වෙයි. තවත් ගොවියෙකු පත්ලේ ඇති ජලය එහි මට්ටම නංවා තම පහළ පිහිටි කුඹුරට ජලය හරවා යැවීමේ අරමුණින් සමහර අවස්ථාවක ජල අපවහන ඇලක් හරස් කරයි. ප්‍රතිඵලය වන්නේ අසල්වැසි කුඹුරුවල තවමත් පවතින වගාවට හානි පැමිණීම පමණක් නොව, ඉතා වැදගත් වෙනත් අපවහන ඇලක් ඇසිරී යාම ය.

මෙවැනි ආරවුල් සම්බන්ධව පොදු ලක්ෂණයක් වන්නේ වෙල්විදානේ ක්‍රමය යටතේ ඒවා ඉක්මනටත්, සාධාරණවත් විසඳේ යයි ගැමියන් සිතීම යි. වෙල්විදානෙ කෙනෙකු ගේ ප්‍රධාන කාර්යයක් වූයේ මෙවැනි අවස්ථාවල දී ප්‍රශ්න විසඳා යුක්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධව නීති පැනවීම යි. උදාහරණයක් විදියට ක්ෂේත්‍ර ඇලේ පළල ප්‍රමාණය, නියම කිරීමත් විය හැකි අතර, එමඟින් මෙවැනි ආරවුල් පැන නැඟීමට ඉඩ මඟ හැරෙනු ඇත. ප්‍රායෝගිකව වැදගත් වන මෙවැනි අධිකාරයක් හෝ සාමාන්‍ය ක්‍රියාත්මක වන නීති ක්‍රමයක් දැනට නොපවතී.

වගාව, පරිසරය හා සමාජය.

මෙතෙක් සාකච්ඡා කරන ලද ප්‍රශ්න පිළිබඳව අප ගේ විශ්ලේෂණ තුළින් පරිසර පාලනය පිළිබඳව ගම් මට්ටමේ සමාජ ආයතනවල දුර්වලතා හා අප්‍රමාණත්වයන් මතු කර දක්වයි. අප අධ්‍යයනයට ලක් කරන ලද ගම්මානයන්හි වී වගා අංශයේ ඵලදා හා නිෂ්පාදනය වැඩි කිරීමේ සැලකිය යුතු ශිල්පීය හැකියාවක් පෙන්නුම් කළ ද, දැනට පවතින ආයතනික හැඩගැස්වීම් යටතේ එම හැකියාවෙන් ප්‍රයෝජන ගත නොහැක. මෙය මූලිකවම සංවිධාන හිඟතාවය සම්බන්ධ කරුණකි. බොහොමයක්ම කටයුතු මිනිස් ශ්‍රමයෙන් හා සරල උපකරණවලින් ඉටු කළ හැක. ප්‍රාග්ධනය සෑහෙන ප්‍රමාණයක් අවශ්‍ය වුව ද, එය එතරම් හිඟ බවක් නොපෙනේ. පසුගිය දශක කිහිපය තුළ අප ගේ නියැදි ගම්මානයන්හි සුළු වාරිමාර්ග හා ජල අපවහන කටයුතුවල සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රාග්ධනයක් මූලිකව කොන්ක්‍රීට් ව්‍යුහයන් සඳහා ආයෝජනය කර ඇත. එහෙත් මෙම ප්‍රාග්ධන ආයෝජනවලට ලැබී ඇති ප්‍රතිලාභ අනුපාතය සාමාන්‍යයෙන් පහළ මට්ටමක පවතී.

යෝග්‍ය ආයතන හා සංවිධානයන්හි හිඟභාවය වශයෙන් ගැටළුව හේතු විනිශ්චය කිරීම පහසු ය. එහෙත් නියත ලෙස හිඟ කුමක් ද, කුමන වෙනස්කම් අවශ්‍ය ද යන්න විස්තර කිරීම පහසු නොවේ. වඩාත් දුෂ්කර විශේෂයෙන් වෙනසක් ඇති කිරීම සඳහා අපහසු අපි ඉදිරියේ දක්නා පරිදි ගැටළු ග්‍රාමීය සමාජ සංවිධාන රටාව තුළ හා රජය හා ගැමියන් අතර සම්බන්ධතා තුළ කිඳා බැස තිබීම යි. අප හඳුනා ගන්නා ගැටළු හා නැමියාවන් වෙනස් කළ නොහැකි හා එනිසා ගම් පරිසරයේ යහපත් පරිපාලනයට ඇති ඉඩකඩ සීමිත බව නිගමනයට ඒම අපහසු නොවේ. මේ සම්බන්ධතාව සම්පූර්ණ බලාපොරොත්තු සුන් නොකර ගම් මට්ටමේ පරිසර පාලනයට සමාජ සංවිධාන කෙතරම් දුරට සම්බන්ධ වන්නේ ද යන්න විස්තර කිරීමට උත්සාහ ගනිමු.

අප ගේ ඉහත විශ්ලේෂණයේ දී එහි ක්‍රියාකාරිත්වය සුදුසු වර්ගයේ සමාජ ආයතන ඇති කිරීම තුළ රඳා පවත්නා පරිසර පාලනයට සම්බන්ධ කෘත්‍යයන් හතරක් පැහැදිලිවම හඳුනා ගෙන ඇත. අප ඒවා සංකීර්ණත්වයේ අනුව සාකච්ඡා කරමු.

1. සරලම ගැටළුව වන්නේ ඉදි කිරීම් කටයුතු භාරව පවත්නා ශිල්පීය නිලධාරීන් හා ප්‍රදේශයේ ගැමියන් අතර වාරිමාර්ග හා ජල අපවහන ව්‍යාපාර සම්බන්ධව අදහස් හුවමාරු වැඩ පිළිවෙළක් සකස් කිරීම යි. මෙහි මූලික අදහස විය යුත්තේ ශිල්පීය නිලධාරීන් ගේ තීරණවලට බලපාන ප්‍රාදේශීය භෞතික හා සමාජ සාධක සම්බන්ධ ප්‍රතිවේධයක් ලබා දීමට සහ ඉදි කිරීමෙන් පසු වාරිමාර්ග ව්‍යුහයන් ගේ පරිපාලනය පිළිබඳව ඇති විය හැකි ගැටළු පිළිබඳව මනා අවබෝධයක් දීමටත් ය. ඉහත දෙන ලද හේතූන් නිසා මෙහි ද ගැමියන් එකිනෙකට පරස්පර විරෝධී අදහස් දීමට ඉඩ තිබේ. එහෙත් මෙම පරස්පර විරෝධී අදහස් තුළින් ම ඉගෙනීමට බොහෝ දෙය තිබේ. ගොවි නියෝජිතයන් සුළු ප්‍රමාණයක ගේ උපදේශ පමණක් සොයා පරස්පර විරෝධී අදහස් මඟ හැර වීමට උත්සාහ නොගෙන අත්‍යවශ්‍ය වන අදාළ ස්ථාන පරීක්ෂා කිරීම සමඟ මහජන රැස්වීම්වල සාකච්ඡා කිරීම යහපත් ය. එය

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගා.ප.පු.ආ
HARTI

22128

ශිල්පීය නිලධාරියා හා ගොවියා ගේ දුරස්ථභාවය අඩු කිරීමට වැඩ පිළිවෙළවල් වෙනස් කිරීම සම්බන්ධ කටයුත්තකි.

II. සංවිධායක, විනිශ්චයකරු, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් සිය කාර්ය ක්ෂේත්‍රය තුළ වෙල්විදානෙ ක්‍රමය වෙනුවට වගා පරිසරය තුළට නැවත හඳුන්වා දීමට නූතන විකල්ප යක් සඳහා ක්ෂණික ප්‍රායෝගික පියවර යෝජනා කිරීම තරමක් අපහසු කාර්යයකි. වෙල් විදානේ ක්‍රමය සාර්ථක වූ ස්ථානයන්හි එය ප්‍රධානව සිදු වූයේ ඔහු සෑහෙන සමාජ තත්වයක් හා ආර්ථික පසුබිමකින් යුක්ත පවුලකින් පත් කර ගැනීම නිසා බව අමතක නොකලයුතු කරුණකි. ඔහු ගේ අධිකාරි බලය ඉහත කී පසුබිමින් මෙන් ම නිල තත්වය තුළින් ද ලබා ගත් අතර, ඔහු ගේ සමාජ–ආර්ථික තත්වය ප්‍රමාණවත් නොවූ අවස්ථාවන්හි තමා රාජකාරිය කාර්යක්ෂමව කර ගැනීමට අපහසු විය. උදාහරණ වශයෙන් පොල්පිටියේ ගොවියන් වෙල් විදානේ ක්‍රමය ගැන ඇඩි උනන්දුවකින් කථා කරනවාක් මෙන් ම එය නැවත ඇති කිරීමට බලවත් කැමැත්තක් දක්වන අතර, වත්තේගම පුද්ගලයන් ඊට ඉතා වෙනස් ආකාරයකින් සිතයි. වත්තේගම වෙල්විදානේ ප්‍රදේශීය කාණ්ඩ දේශ පාලනයෙහි තදින් ගැලී සිටි බව පෙනෙන අතර, පොල්පිටියේ වෙල්විදානේවරු පැමිණියේ ඉහළ සමාජ තත්වයක් උසුලන ලද කුඩා සමූහයක් තුළිනි. අද වුව මෙම කණ්ඩායම සමාජ ගෞරවය ලබයි. පොලිපිටියේ තත්වය අති විශේෂය. ස්වාධීනත්වය ලබා ගන්නා අවදියේ සාමානයයෙන් ගමේ ජන ජීවිතය පාලනය කළ ඉඩම් හිමි පවුල්වල සමාජ, ආර්ථික, දේශපාලන තත්වය හීන වී යම පසුගිය දශක කිහිපයේ දක්නට ලැබෙන ප්‍රධාන සමාජ විපර්යාසයන් ගෙන් එකකි.

මෙම හේතුවෙන් වෙල්විදානේ ක්‍රමය අද නැවත හඳුන්වා දීමට නොහැකිව තිබේ. ඉහළ සමාජ–ආර්ථික තත්ව අවශ්‍යතාවය නැමති සම්පත හිඟ, බැවින් එවැනි සමාන හඳුන්වා දීමක දී සෑහෙන දුරට නිල අධිකාරී බලතල තුළින් උපකාරී වීම අවශ්‍ය කෙරේ. එහෙත් ගැටළුව මතු වන්නේ මෙහි දී ය. ඔහු තවත් රජයේ නිලධාරියෙක් නම් ඔහු 'වෙල්විදානේ' ට ආදේශක නොවන්නේ වෙල් විදානේ ක්‍රමයේ හරය වන්නේ ප්‍රදේශයෙන් ලබා ගත හැකි බව ප්‍රදේශය ගැන දැනුම ඇති බව අවිධිමත් ක්‍රියාවලිය සහ ප්‍රදේශීය කටයුතුවල තදින් නියැලීම නිසා යි. ගොවි කාරක සභා වෙනුවට වගා නිලධාරීන් පත් කිරීමේ දී මෙම කරුණු සැලකිල්ලට ගෙන ඇත. වගා නිලධාරීන් තම ගමේ ම වැඩ කරන ප්‍රදේශයේ ම පුද්ගලයන් වන අතර, මාරු කළ නොහැක. මෙය යහපතට කරුණු ය. එහෙත් **දේශපාලන** පත්වීම් ලද මෙම තරුණ නිලධාරීන් තුළ ගැමියන් ගේ ගෞරවාදරය දිනා ගැනීමට සමත්කමක් නැති අතර, ඔවුන් රාජ්‍ය බලතල ද ඇත්තේ සීමිත වශයෙනි.

විනිශ්චයකරු මෙන් ම නීතිය ක්‍රියාත්මක කරන්නා වශයෙන් ඔහු ගේ කාර්ය කොටස තුළ වෙල් විදාරන් වෙනුවට කාර්යක්ෂම ආදේශකයක් වශයෙන් වගා නිලධාරීන් සාර්ථක විය නොහැකි බව අප ගේ විශ්ලේෂණ මෙන් ම ක්ෂේත්‍ර නිරීක්ෂණ තුළින් හෙළි වෙයි. ග්‍රාමීය උසාවි නැවත පිහිට වූ විට පරතරය තරමක් පිරවෙනු ඇත. කොතරම් සරල ක්‍රියාදාමයක් තුළ ක්‍රියා කළ ද ඒවා උසාවි බව සැලකිය යුතු ය. බොහොමයක් ප්‍රශ්න වේවා වෙත ගෙන යාමට තරම් නොවන සුළු ඒවා විය.

හැක. උදාහරණයක් වශයෙන් අසල්වැසි ගොඩ ඉඩමේ පොල් ගස් මගින් තමා ගේ වගාවට ආවරණය වන වී ගොවියා ගේ ප්‍රශ්නය ගත හැක. තවදුරටත් බලනවා නම් සමහර ආරවුල් පුද්ගලයන් අතර පමණක් ඇති වන ඒවා නොවන අතර, පුද්ගලයකු හා සමාජය අතර ඇති වනු ඒවා වේ. උදාහරණයක් වශයෙන් එක් ගොවියෙකු ක්‍රම ක්‍රමයෙන් ඇලට අයිති ඉඩම් අල්ලා ගනිද්දී අනෙක් සියළුම දෙනාට බලපෑව ද නඩු මාර්ගයට බැසීමේ වියදම් හා කරදර විඳීමට කිසිම ගොවියෙකු තුළ අභිප්‍රේරණයක් ඇති නොවනු ඇත. මෙවැනි ප්‍රශ්නවලට පහසු විසඳීම් නොමැත. වෙල්විදානේ ක්‍රමය නැවත පිහිටුවිය හැකි නොවන අතර, අනුගමනය කෙරෙන ක්‍රියාදාමය හා මුහුණුවර අනුව රජයේ නිලධාරීන්ට තෘප්තිමත් ආකාරයකට කටයුතු කළ නොහැකි වාක් මෙන් ම ගොවි සංවිධාන ප්‍රයෝජනයට ගැනීමට ගන්නා ලද උත්සාහයන් ද අසාර්ථක වී ඇත. වඩා කාර්යක්ෂම ගොවි සංවිධාන පැන නැගෙන තුරු ආරවුල් විසඳීමට විධිමත් නීති මාර්ග කෙරෙහි වඩ වඩා විශ්වාසය තැබීම සමහර විට නොවැළැක්විය හැක.

III. ඉහත ඡේද දෙකෙහි දක්වන ලද බොහොමයක් අදහස් නඩත්තුව සහ අත්‍යවශ්‍ය වේ නම් ගම් මට්ටමේ ඇල, ඇනිකට්, වැව්, සමෝච්ච දිය අගල් වැනි නව අව ව්‍යුහයන් ඉදි කිරීම සඳහා ශ්‍රම යොදවා ගැනීම පිළිබඳව ප්‍රශ්නයේ දී අදාළ වේ. මෙහි ද ප්‍රධාන ප්‍රශ්න දෙකක් පැන නගී. රජයේ මැදිහත් වීමෙන් සහ පිහිටාධාර මගින් ඇති වන වියදම් සහ ගැටළු සලකා බලන විට සාධාරණ විය නොහැකි, සාපේක්ෂව ඉතා සුළු කාර්යයන් ඉටු කිරීම පවා ගොවියන් රජයෙන් බලාපොරොත්තු වන තත්වයට පැමිණ තිබීම එක ප්‍රශ්නයකි. අනෙක එවැනි කටයුතු ආරම්භ කිරීමට හා සුපරීක්ෂා කිරීමට ඇති ප්‍රාදේශීය සංවිධානයන් ගේ හිඟභාවය යි. විසඳුම් සෙවීමේ දී ක්‍රමික නඩත්තුව හා නව ඉදි කිරීමේ කාර්යයන් දෙක වෙන් කර ගැනීම ප්‍රයෝජනවත් වන බව පෙනේ. ක්‍රමික නඩත්තු සම්බන්ධව බලන විට වඩා ප්‍රතිඵලදායී ලෙස පිළිගත යුත්තේ වෙල්විදානේ ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ ක්‍රියාවලීන් ගේ සමහර අංග අනුගමනය කිරීම ය. එනම්, ඇල කොටස් කර ගොවියන්ට ඒ ඒ කොටස් නඩත්තුව සඳහා පුද්ගලිකව භාර දීමත්, එම වැඩ කොටස් නියමාකාරයෙන් නොකෙරුණ හොත් දඩ ගැසීමත් ය. සාමාන්‍යයෙන් ඔවුන්ට වැඩි උනන්දුවක් ඇති කිරීම සඳහා හැකිතාක් දුරට තම කුඹුරුවලට ආසන්නම ඇලවල් භාර දෙනු ලැබේ. එවැනි ක්‍රමයක පවතින ඉමහත් වාසිය වන්නේ වගකීම් හරියාකාර පැහැදිලි කර දුන් පසු නොකඩවා පරීක්ෂා කිරීමට කෙනෙකු සිටිනවා නම් එම ක්‍රමය බොහෝ දුරට කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම ය. මෙම පුද්ගලයා වගා නිලධාරියා විය යුතු ය. මෙම ක්‍රමය හරියාකාර ක්‍රියාත්මක වීමට නම් කාර්ය ඉටු නොකෙරෙන අවස්ථාවල දඩ ගැසීමට වගා නිලධාරියාට රජයෙන් බලය පැවරීම අවශ්‍ය වන අතර, ග්‍රාමීය උසාවියෙන් අපැල් ගැනීමට දෙපසටම අවස්ථාව තිබිය යුතු ය. පාලනයට වඩා අපහසු විය හැක්කේ නව ඉදි කිරීම් හෝ නිතර ඇති නොවන කුණු ඉවත් කර වැටි හැරීම, විශාල ඇලක් ශුද්ධ කිරීම වැනි අක්‍රමික නඩත්තු කටයුතු ය. මිනිස් ශ්‍රමය විශාල ලෙස සංවිධානය කළයුත්තේ මෙවැනි කටයුතුවල දී ය. එසේ කිරීමට අත්‍යවශ්‍ය ක්‍රියා පිළිවෙළවල් සහ මාර්ග දැනට තිබෙන බැවින් ගැටළුව වන්නේ ඒවා කාර්යක්ෂම ලෙස හැඩ ගැස්මයි. මෙවැනි ව්‍යාපාර කටයුතුවල සහභාගි කර ගැනීමට දිරි දීම් වශයෙන් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මාර්ගයෙන් ආහාර ආධාර දීම වැනි ක්‍රියා පිළිවෙළක් සහ අවශ්‍ය ආධාර සහ සංවිධාන යයි. ප්‍රශ්නය වී ඇත්තේ උනන්දුව නැතිකම ය. මේ සඳහා ද සුදුසු ප්‍රාදේශීය සංවිධාන

තිබේ. නිලධාරියා වන්නේ වගා නිලධාරියා ය. නොකඩවා කෙරෙන පරිපාලන බලපෑම් තුළින් උනන්දුව ඇති කළයුතු ය. අඛණ්ඩ පදනමක් මත නූවුවත්, නිරායාශයෙන් ම පැන නගින උද්‍යෝගය හා උනන්දුවක් ගැමි ජනතාව තුළ පවතින බව මේ දක්වා ලද අත්දැකීම් වලින් පෙනී යයි. අද ගමේ දක්නට ලැබෙන මූලික ප්‍රශ්නය ලෙස පෙනී යන්නේ අඛණ්ඩ පදනමක් මත ගැමියන් සංවිධානය කිරීමට තරම් බලවත් අධිකාරී තත්වයක් නොවීම ය. මෙය තදින් බා වැඳුන සමාජ නැමියාවන් ගේ විශේෂයෙන් ම දේශපාලන හා සමාජ ජීවිතය ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට වෙනස් වීම වැනි මූලික සමාජ විපර්යාසයන් නිසා ගමේ සමාජ ඒකක ස්වරූපය බිඳී යාමේ ප්‍රතිඵලයකි වෙය. ප්‍රජා ක්‍රියාවන් නිසා තවම ඉඩකඩ තිබුණ ද පෙරට වඩා රජයේ ආයතන මගින් පිටුබලයක් තිබිය යුතු ය. සුළු වාරිමාර්ග හා අපවහන කටයුතුවල මෑත දශක කිහිපයේ දී රජයේ සහභාගිත්වය වැඩි වී ඇත ද, ප්‍රධාන වශයෙන් එය මුදල් සැපයීමට සහ පෙර ගැමියන් විසින් ඉටු කළ කෘත්‍ය යන් භාර ගැනීමටත් වේ. දැනට අවශ්‍ය වන මැදිහත් වීම වන්නේ මුදලින් කෙරෙන රජයේ ආධාර අඩු කර වඩ වඩා දිරිදීම් සහ සංවිධානාත්මකව උපකාරය කිරීම යි.

IV. අවසාන ප්‍රශ්නයට විසඳුම් ඉතාම දුරස්ථර බව පෙනෙන්නකි. වඩා සාර්ථක පාරිසරික පාලනයක් සඳහා භෞතික පරිසරයේ සෑහෙන වෙනස්කම් ඇති කරන අතරම සෑහෙන දුරට ජන ජීවිතය නැවත සංවිධානය කළ හැකි ආයතන තිබිය යුතු ය. අපි උදාහරණ කිහිපයක් ගෙන බලමු. කැලෑ නැවත වගා කළ හැක්කේ යම් ආයතනයකට පාවිච්චි නොකරන හා හරියාකාර ප්‍රයෝජනයට නොගන්නා ඉඩම් පවරා ගෙන කැලෑ සඳහා වෙන් කිරීමට හැකි නම් පමණි. බීජ සිට වූ විට ඒවා ආරක්ෂා කළයුතු ය. කැලෑ වඩුනු පසු දර ලබා ගැනීමට හා වෛන්ද්‍රිය පෝර සඳහා අමු කොළ ලබා ගැනීමට ගෘහයන් අතර බෙදා හැරිය යුතුවාක් මෙන් ම කැලෑව විනාශ නොවීමට නම් මෙම අයිතිවාසිකම් ප්‍රයෝජනයට ගන්නා ආකාරය කිට්ටු සුපරීක්ෂාව යටතේ තිබිය යුතු ය.

වැලිගලගොඩ යායත් ඉස්මත්තේ වැවක් තැනීමට ඉතාම සුදුසු ස්ථානයක් දක්නට ලැබේ. ආරක්ෂා කාරී ජල සැපයුමකට අමතරව මසුන් ඇති කිරීමේ ජලාශයක් ඇති කිරීම මින් ලැබෙන ප්‍රධාන ප්‍රයෝජනය විය හැක. ශිල්පීය වශයෙන් බලන කළ අවස්ථාව ඉතා පැහැදිලි ය. එහෙත් සංවිධානාත්මක වශයෙන් බලන කළ එය එසේ නොවේ. අඩුම වශයෙන් වගාකරුවන් හය දෙනෙකු වත් ඉවත් කිරීමට සිදු වේ. ඉතාම නිසරු සහ කන්නයකට අක්කරයකට බුසල් දොළහකට වඩා ලබා නොදෙන ඉඩම් හෙයින් ඔවුනට ඇති වන පාඩුව ඉතා සුළු විය හැකි ය. වන්දි වශයෙන් ඔවුන්ට මසුන් ඇති කිරීමෙහි අයිතිය ලබා දිය හැක. ජලාශය රොන් මඩින් ඉක්මණින් පිරී නො යාමට නම් ආසන්නව පිහිටි කුරුඳු ඉඩම් හිමියන්ට වැව වඩා ඇති ඉඩම්වල පස් සංරක්ෂණ පියවර වල් ගැනීමට සිදු වනු ඇත. බලාපොරොත්තු වැව් ප්‍රදේශය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට නම් නිවසක් හෝ දෙකක් ජලයෙන් යට වීමට ඉඩ ඇති අතර, කජ්ජත්ත පාරක් වෙනස් කිරීමට සිදු විය හැක. ආර්ථික හා ශිල්පීය අංශයෙන් බලන කළ එය දියුණු කළ හැකි ව්‍යාපාරයක් බව පෙනී ගිය ද, පරිපාලන අංශයෙන් බලන ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදු වන බව පෙනේ. කිසිම උප දිසාපතිවරයෙකු ගෙන් මෙම කාර්ය සිදු වනු බලාපොරොත්තු විය නොහැක. ඔවුන්ට මේ සඳහා [illegible]තෙන් කාලය හෝ සම්පත් හෝ පරිපාලන බලය හෝ අවශ්‍ය වන ප්‍රාදේශීය දැනුම හෝ නො මැත. එවැනිම ප්‍රශ්න සුළු ප්‍රමාණයෙන් කුඩා ව්‍යාපාර තුළ දක්නට ලැබේ. පිටවානක් අවශ්‍ය

කාර්ය ද කිරීම සඳහා පිටවානක බැම්ම ඉතා දුර්වල සහ පටු විය හැක. එහෙත් කාර්ය හරියාකාරව කර ගැනීමට ඉඩ හැරීම සඳහා තම කුඹුරෙන් අඩි දෙකක් කැප කිරීමට සිය කැමැත්තෙන් ඉදිරිපත් වන ගොවියෙකු සොයා ගැනීමට අපහසු ය. බලයෙන් යොද ක්‍රියාවට නැගුව ද විශාල මුදලක් වැය කර කාර්ය සම්පූර්ණ කිරීමෙන් පසුව ඔහු එය මුලින් තිබූ තත්වයට ම පෙරලා ගනු ඇත. ඉතා මෑතක දී වැලිගලගොඩ එවැනිම සිද්ධියක් ඇති විය.

ගම් මට්ටමේ කාර්යක්ෂම පරිසර පාලනයක් සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි සමහරක් මෙම උදාහරණ කිහිපයෙන් විස්තර වේ. ප්‍රශ්නය මූලික කාර්යක්ෂම ආයතන ඇති කිරීම යි. කාර්යක්ෂමතාවයට ප්‍රධාන අවශ්‍යතා දෙකක් වේ. එනම් ප්‍රදේශය පිළිබඳ මනා දැනුමක් හා පොදු යහපත වෙනුවෙන් පටු ආත්මාර්ථකාමී අයිතීන් කැප කිරීමට උනන්දු කළ හැකි මූල ගණන නම් බල කළ හැකි නීති බල යට වඩා ක්‍රියාවට යෙදිය හැකි බලයත් ය. පළමුවැන්න සඳහා ගැමියන් ගේ නොමඳ කැප වීමත් දෙවැන්න සඳහා රජයේ ශක්තිමත් සහයෝගයත් අවශ්‍ය වේ. මේ ලාක්ෂණික දෙක සාර්ථකව එක් කෙරෙන ඕනෑම ආයතනයක් මේ දක්වා අත්දැකීම් ලද ඕනෑම ග්‍රාමීය ආයතනයකට වඩා පැහැදිලිවම වෙනස්ව පෙනී යනු ඇත.

මෙම කොටස ඉතාමත් වැදගත් නිරීක්ෂණයකින් සමාප්ත කරමු. එක් අතකින් ජනගහණ වර්ධනය ඉඩම් හිඟ භාවය සහ කැලෑ හෙළි කිරීම නිසා එදාට වඩා අද ගම්බද පරිසරය සම්බන්ධව මනා පාලනයක් අවශ්‍ය කෙරේ. විශේෂයෙන් ම කැලෑ හෙළි කිරීමෙන් ඇති වන භයානක ප්‍රතිඵල මඟ හැර වීමට හැකිතාක් දුරට තදබල පියවර ගත යුතු ය. අනෙක් අතට ඇති වෙමින් පවතින සමාජ විපර්යාස රටාව පැරණි වී වගාව මත ගොඩ නැඟුණු සමාජ රටාව අවකලනය කෙරෙහි යොමුව ඇතැයි කිව හැක. ගැමියන් පුළුල් ආර්ථික කටයුතු පර්යායක් අනුගමනය කෙරෙන අතර, ඔවුන් කෙරෙහි ගම් මට්ටමේ පවතින බලපෑම් වලට වඩා පුළුල් ජාතික සංස්කෘතියක පවතින ධර්මතා සහ දේශපාලන අගයන් ගේ බලපෑම් වැඩි වෙමින් පවතී. ඇත්තවශයෙන් ම සිදු වී ඇත්තේ ගමෙහි ස්වාධීනත්වය සහ තනිව හැඩ ගැසීමේ හැකියාව බෙහෙවින් හීන වී තිබීම යි. ඇලවල් ශුද්ධ කිරීමේ දී තමාත් එකතු වීමට, නිතර වැවේ සුරක්ෂිත ගැන සොයා බැලීමට, අසල්වැසියන් ගේ කුඹුරු තම පොල් ගස් වලින් වැසී යයි නම් ඒවා කපා දැමීම යනාදියට සිරිත් විරිත් වලින් සහ අනෙක් ගොවියන් ගෙන් හෝ බලසම්පන්න ඉඩම් අයිතිකරු ගෙන් එන සදාචාර බලපෑම් ප්‍රමාණය තවදුරටත් ප්‍රමාණවත් නොවේ. වාරිමාර්ග ආරවුල් ගමේ සැලකිය යුතු ගොවියෙකු විසින් සාකච්ඡා කොට විසඳීමට ඇති හැකියාව තවදුරටත් නැතිව ගොස් ප්‍රශ්නය යට ගැසී තිබීමට හෝ පොලීසියට හෝ වෙනත් එවැනි ආයතනයකට යාමට සිදු වී තිබේ. අප පුළුල් වශයෙන් අදහස් කරන ලද 'පරිසර පාලනය' සඳහා අවශ්‍ය කරන බොහොමයක් කටයුතු එදිනෙදා සමාජ කටයුතු රටාව තුළින් තව දුරටත් අඩක් නිතැතින් පැන නොනඟී. ඒ වෙනුවට විධිමත් ක්‍රියාවලියක් ඇති කර ගැනීමට සිදු වේ. ගොවි කාරක සභා සභාපතිට/වගා නිලධාරියාට හෝ පොලීසියට පැමිණිලි කිරීමෙන් සහ විධිමත් නීති පැනවීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මේ හැම දෙයකටම සෑහෙන කාලය වැය වේ. විධිමත් ක්‍රියා වලින් අනුගමනය අප මතු කරන ප්‍රධාන අදහස මෙය යි. අවධිමත් සමාජ රීතීන් වෙනුවට කෙරෙන මෙවැනි පරිසරයක අමතර දිගු කාලයක් අවශ්‍ය වන අතරම, බලතල සඳහා විධිමත් අනුමැතිය ද අවශ්‍ය වේ. තේරී පත් වූ සහ නම් කර පත් කර ගත් ගොවි ආයතන, ගොවි කාරක සභා සහ

පලදා වර්ධන කමිටු අසාර්ථක වීමට ප්‍රධාන වශයෙන් බලපාන ලද හේතූන් මේවා වේ. පළමු වන කරුණ ගොවීමක් නොලද ස්වේච්ඡා සාමාජිකයන්ට විශේෂයෙන් ම සභාපතිට විශාල පරාසයක පැතුරුණ රාජකාරී පැවරුන අතර, හරියාකාර ඉටු කෙරේ නම්, පූර්ණ කාලීන රැකියාවකට සමාන වීමට ඉඩ තිබුණි. දෙවැනි කරුණ බොහොමයකට රජයේ නිලධාරීන් ගේ බලය, සහ පැහැදිලි සහයෝගය සහ අදාළ රජයේ ආයතනවල පිටුබලය නොතිබීම යි. බොහෝ අවස්ථාවල වගාකරුවන්ට ඔවුන් ශාසලකා කටයුතු කිරීමට හැකි විය. ඔවුන් වෙනුවෙන් කෙරෙන හිළවු පත්වීම් සාර්ථක වීමට නම් ඔවුන්ට බලය මෙන් ම සෑහෙන කාලයක් දීම ද අවශ්‍ය වේ.

## නි ග ම න

I. සාපේක්ෂව නිසරු කෘෂිකාර්මික පරිසරයේ වුව ද, වඩා හොඳ පාරිසරික පාලනය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය සහ සේවා නියුක්තිය නැංවීමේ ඉහළ හැකියාවක් පහත රට තෙත් කලාපයේ පවතී.

II. පාරිසරික පාලන ක්ෂේත්‍රය තුළ විසඳිය යුතු ප්‍රධාන ප්‍රශ්න තුනක් ඇත.

අ. කැලෑ හෙළි පෙහෙළි කිරීම සහ ඉන් ඇති වන ප්‍රශ්න වන පාංශු ඛාදනය හා පසෙහි නිසරු භාවය තෙත් කලාපයේ වුව ඇති වන වාරි ජල හිඟතාවය.

ආ. පවතින වාරිමාර්ග හා ජල අපවහන අව ව්‍යුහයන් ගේ නඩත්තුව සම්බන්ධ අඩුපාඩු.

ඇ. වාරිමාර්ග ජල අපවහන, පස සංරක්ෂණය, මාර්ග සහ මඩුන් ඇති කිරීමේ අංශවල නව ඉදිකිරීම් මගින් පවතින හැකියාවන් ගේ සම්පූර්ණ ප්‍රයෝජන ගැනීම.

III. වඩා හොඳ පාරිසර පාලනයට බලපාන ප්‍රධාන අවහිරතා දක්නට ලැබෙන්නේ සංවිධාන තුළය.

IV. පාරිසරික පාලනයේ දී දැනට රජයේ මැදිහත් වීමේ රටාව තුළින්, විශේෂයෙන් සුළු වාරිමාර්ග හා ජල අපවහන කටයුතුවල දී, අවාසිදායක ප්‍රතිඵල කිහිපයක් ඇති වෙයි. ව්‍යාපාර තෝරා ගැනීමේ දී ඇති වන දුර්වලතාවන්, කොන්ක්‍රීට් ඉදි කිරීම් සඳහා ප්‍රමාණය ඉක්මවා කෙරෙන ආයෝජන, සාපේක්ෂව ඉතා සුළු නඩත්තු කටයුතු සඳහා පවා ගොවියන් රජය කෙරෙහි බලාපොරොත්තු තැබීම වැඩි වීම.

V. පැරණි වෙල්විදානේ ක්‍රමය ඒ වෙනුවට පසුව හඳුන්වා දෙන ලද විවිධ ගොවි සංවිධානවලට වඩා සමහර අංශවලින් සපලදායී විය. කෙසේ වුව මෙම සපලදායී බවට හේතු වූයේ පැරණි සහ ඉහළ ධුරාවලියකින් යුතු සමාජ ක්‍රමයක වෙල් විදානේ වරයාට තිබූ තත්වය තුළිනි. එහෙත් එම සමාජ ක්‍රමය දැනට බොහෝ දුරට වෙනස්ව පවතින අතර, පැරණි ආකාරයෙන් ම වෙල්විදානේ ක්‍රමය නැවත හඳුන්වා දීම අපහසු ය.

VI. පාරිසරික පාලනය සඳහා සපලදායී සංවිධාන සැලසුම් කිරීම අපහසු වී ඇත්තේ ගොවි සංවිධාන ගොඩ නැඟෙන අවිධිමත් ආයතන කාර්යක්ෂම හා බල සහිත වීමට මූලික සමාජ නැමියාවන් මගින් අපහසු කර වන බැවිනි.

VII. විධිමත් ක්‍රියාවලින් අනුගමනය කිරීමෙන් හා රජයේ ප්‍රබල සහයෝගය ලබා දීමෙන් පාරිසරික පාලනය සඳහා අවශ්‍ය නව ආයතන තුළින් සමාජ වෙනස්වීම් පිළිඹිබු විය යුතු යි.

VIII. අංශ පහක් සම්බන්ධයෙන් ක්‍රියා පිළිවෙත් හා ආයතන අවශ්‍ය වේ.

අ. සිවිල් ඉංජිනේරු කාර්ය මණ්ඩලය හා ගැමියන් අතර වඩා විධිමත් අදහස් හුවමාරුවක්

මගින් සුළු වාරිමාර්ග හා ජල අපවහන සම්බන්ධව ව්‍යාපාර තෝරා ගැනීමේ කටයුතු දියුණු කිරීමට උපකාරී වේ.

ආ. වගාවට සම්බන්ධ සුළු ආරවුල් විසඳීම සඳහා සරල ලාභදායි පහසුවෙන් ලබා ගත හැකි යුක්තිය පසිඳලීමේ ක්‍රියා මාර්ග සඳහා ඉඩකඩ සැලසිය යුතු ය.

ඇ. වාරිමාර්ග හා අපවහන අව ව්‍යුහයන් නඩත්තු කිරීමේ වගකීම පෞද්ගලිකවම වගාකරුවන් අතර බෙදා හැරිය යුතු ය.

ඈ. වැව් වලින් ජලය නිකුත් කිරීම, කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපාරය සඳහා ගමෙහි මිනිස් ශ්‍රමය සංවිධානය කිරීම වැනි කටයුතුවල සුපරීක්ෂාව හා සංවිධානය කිරීම් සඳහා වගා නිලධාරීන්ට අවශ්‍ය තරම් බලතල ලබා දිය යුතු ය.

ඉ. ගමෙහි ඉඩම් භාවිතය නැවත සංවිධානය කිරීම සඳහා පුද්ගලික ඉඩම් හිමියන් කෙරෙහි බලය පාවිච්චි කළ හැකි සංවිධාන ඇති කිරීමේ ප්‍රශ්නය කෙරෙහි අවධානය යෙදිය යුතු ය.

-/තිසවක. 1979-11-22.